# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,908 — 1970 මැයි 29 වැනි සිකුරාදා — 1970.5.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම එක වසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 701 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 732 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 704 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 722 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 730 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 733 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 731 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට සාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අර මුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්තම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ [illegible] පිටුවලරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියලුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියලුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1968 දෙසැම්බර් මස 14 වැනි දින,**
**ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍ය නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන් හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය .

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වේනොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථ්‍යය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ ඇතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුව හොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැණීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

## ලංකා පොහොර සංස්ථාව

### ලිපිකරු හා සමාන සේවාවන්හි III වන ශ්‍රේණියේ හා ගබඩා භාරකරු සේවයේ II වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම

ඉහත සඳහන් සේවාවන්හි ඇති (දැනට දළ වශයෙන් 20–25 පමණ වන) ඇබෑර්තුවලට ලාංකික පුරවැසි අයදුම්කරුවන් අතුරෙන් තරඟ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.

I. **වේතන පරිමාණය.**—සේවක අර්ථසාධක අරමුදල් වරප්‍රසාද (සේව්‍යයාගෙන් 15%ක් ද, සේවකයාගෙන් 10%ක් ද යන වශයෙන්) ඇතුළුව මසකට (සියලු දීමනා සහිත) රු. 230—13 × 10; 6 × 15—450.

II. **අවශ්‍ය සුදුසුකම්.**—(1) වයස : 1970 ජූනි මස 11 වන ද වන විට වයස අවුරුදු 30කට වැඩි නොවිය යුතුයි.

(2) අධ්‍යාපන සුදුසුකම් :

(i) අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සඳහා සම්මාන සාමර්ථයක් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන වන අයුරින් අධ්‍යාපන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ); සහ

(ii) (අ) ඉහත සාමර්ථය ලද අවස්ථාවේදී ම තවත් වැඩිපුර සම්මාන 4ක් ලබා තිබීම; හෝ

(ආ) උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.

බඳවා ගැනීම් කාර්‍ය පරිපාටිය පිළිබඳ සියලු විස්තර සහ මූලික අයදුම් පතේ පිටපත්, පෞද්ගලිකව පැමිණ හෝ ස්වකීය ලිපිනය සහිත මුද්දර ගැසූ දිග ලිපි කවරයක් සමඟ ලිපියක් එවා හෝ, කොළඹ 4, (තැ.පෙ. 841), ගාලු පාර, අංක 746, දරණ ස්ථානයේ පිහිටි, ලංකා පොහොර සංස්ථාවේ විමසුම් කාර්‍යාලයෙන්, ලබාගත හැකි ය.

1970 ජූනි මස 1 වන ද සිට 1970 ජූනි මස 10 වන ද දක්වා අයදුම්පත් ලබාගත හැකි වේ.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 1970 ජූනි මස 11 වන බ්‍රහස්පතින්දා වනු ඇත.**

සභාපති,
ලංකා පොහොර සංස්ථාව.

1970 මැයි මස 25 වන දින,
තැ.පෙ. 841,
කොළඹ.

5–671—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුරු—ස්ථිර/තාවකාලික

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා පරිවර්තක තනතුරු (ස්ථිර සහ තාවකාලික) සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතියේ ප්‍රකාර පිළියෙල කරනු ලබන අයදුම් පත් වර්ෂ 1970 ජූනි 13 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප.—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය : රු. 6,600—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 9,240 කි. වසරකට රුපියල් 8,280 දක්වා වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. සේවා කොන්දේසි :—

(අ) ස්ථිර තනතුර :

(i) මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාරගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

(ආ) තාවකාලික තනතුර :

(i) මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මසක් කල්දීමෙන් පසු ඕනෑම අවස්ථාවක සේවයෙන් අස් කිරීමට යටත් වේ.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනයකිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් : හැම අයදුම්කරුවෙකුම—

(අ) සිංහල භාෂාව විෂයයක් වශයෙන් ඇති උපාධියක් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ අයකු, නැතහොත්,

(ii) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක පළපුරුදුකම් ඇත්තාවූ අයකු හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තෝරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි වූ ද, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තා වූ ද, ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු බවටත් ;

(ආ) 1970 මැයි මස 29 වැනි දට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු බවට හා 50 ට නො වැඩි බවටත් (දැනට ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට මේ වයස් සීමාවන් අදාළ නොවේ.)

(ඇ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත්,

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකුම විසින්ම පහත පෙනෙන සහතිකවල පිටපත් (මුල් ලිපි නොවේ) තම අයදුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නො ලැබේ) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම්, සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍ර ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇත් යෝග්‍යතාව, යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබා ගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාමෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේවා බලාපොරොත්තු නොවේ.)

සැළක්ය යුතුය.—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි යම් අවාසියක් වෙතොත් එය අයදුම්කරුවන් විසින් විඳ දරා ගත යුතුවේ. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, ඒ අයදුම් පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාදවීමට සෑහෙන හේතු දක්වමින් එය අයදුම් පත් බාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළ හොත් ද පමණකි.

7. අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකු ගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, තැ. පෙ. 598, 22, ඊඩ් මාවත, කොළඹ 7 යන ලිපිනයටය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි (II) වැනි ඡේදයෙහි පළවූ, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. එවන සෑම අයදුම්පතක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්ට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකා බලනු නො ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1970.5.17 වෙනිදා,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, ඊඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුරු—ස්ථිර/තාවකාලික පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම. (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1970 මැයි මස 29 වැනි දිනට සම්පූර්ණ වයස :—
   අවුරුදු :——, මාස :——, දවස් :——.
   (ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ හෝ වයස පිළිබඳ විශේෂ සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි) :————.

4. රටවැසි භාවය සහ එය කෙසේ හිමිවීද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.
   (ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) :————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථ්‍යය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි. සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි) :————.
   (ආ) දෙමළ සහ/හෝ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඇතිව සාමාර්ථ්‍යය ලත් උසස්ම විභාගය :————.
   දෙමළ :————.
   ඉංග්‍රීසි :————.

9. (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම්, විස්තර සඳහන් කරන්න :————.
   (ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තීබේ නම්, ඒවාද සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ කාලසීමාවන් ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටි නම්, ඇතට දරන තනතුරු ද වාර්ෂික වැටුප ද සඳහන් කරන්න :————.

11. **විශේෂ පළපුරුදුකම්, පුහුණුවීම්, සුදුසුකම් හෝ හිමිකම් :—**

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනෙකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි.)

(i) ........................................

(ii) ........................................

(iii) ........................................

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතුයි. මෑතක දී ලබාගත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග; නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

15. ස්ථිර තනතුරට පත් කර ගනු නොලැබුවහොත් තාවකාලික පත්වීමක් සඳහා සලකා බලනු ලැබීමට කැමැත්තේ ද යන්න සඳහන් කරන්න :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය හෝ බව පත්වීම දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද පත්වීම ලැබුවාට පසු හෙළිවුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටිමි. මේ අයදුම්පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය හා නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–603—70.5.29. දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය (අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව)

### ආහාර කාර්මික විද්‍යාව පිළිබඳ ඇවුරුදු පශ්චාත් උපාධි විද්‍යා පන්ති (ඇම්.ඇස්.සී.) පාඨමාලාව

ඉන්දියාවේ, මයිසූර්හි ප්‍රධාන ආහාර කාර්මික පර්යේෂණ ආයතනයේ ජාත්‍යන්තර ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අයත්, ආහාර කාර්මික විද්‍යාව පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ, ආහාර කාර්මික විද්‍යාව පිළිබඳ ඇවුරුදු පශ්චාත් උපාධි (ඇම්. ඇස්. සී.) පාඨ මාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. මේ පාඨමාලාව නිම කිරීමෙන් පසු අයදුම්කරුවන්ට රක්ෂාව සැපයීමට රජය බැඳී නොමැත.

3. රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් හා ආහාර කාර්මික විද්‍යාව පිළිබඳ කටයුතුවල යෙදී සිටින වෙනත් අයගෙන් ද ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

4. **සුදුසුකම්.**—අයදුම්කරුවන් රසායන විද්‍යාව විෂයයක් සහිතව කෘෂිකර්මය හෝ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය, ක්‍ෂුද්‍ර විද්‍යාව හෝ සත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විද්‍යාව ආහාර කාර්මික විද්‍යාව හෝ ගැන පිළිගත් විශ්ව විද්‍යාලයක **උපාධිධාරීන් විය යුතු අතර, විශ්ව විද්‍යාල හෝ විද්‍යාල තත්ත්වයෙන්** අඩුම ගණනේ අවුරුදු දෙකක්වත් ගණිතය කර තිබිය යුතුය.

5. සුදුසුකම් ඇති රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර නියමිත දිනට ප්‍රථම දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ඒවා ප්‍රමාද වීමට සැලකිය යුතු හේතු දක්වා ඉල්ලුම් පත්‍ර භාර ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කරනු ලැබුවහොත් මිස, නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. "ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පශ්චාත් උපාධි (එම්. එස්. සී.) **පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍ර" කියා ලියුම් කවරයේ වම් කෙළවරේ ලිවිය යුතුය.**

7. ඉල්ලුම් පත්‍ර, 1970. 6. 11 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

8. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ.

අලෙවි කිරීමේ කොමසාරිස්.

1970. 5. 22 දින,
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ල,
බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 1.

5–676—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

ඊ. 5/65 (ii) වෙළුම

ලංකා පරිපාලන සේවයේ v වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීමේ විවෘත තරඟ විභාගයේ, පහත සඳහන් විභාග පරිපාටිය, ප්‍රසිද්ධ කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර තිබේ.

**1970.2.13** වැනි දිනැති අංක 14,893 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද **1970.1.31** වැනි දිනැති විභාග පරිපාටිය මෙයින් අවලංගු කරනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.**

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
තැ. පෙ. අංක 500, කොළඹ 1.
1970 මැයි මස 10 වැනි දින.

## ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශසේවයට ඇතුළත් කර ගැනීමේ විවෘත තරඟ විභාගය

### විභාග පරිපාටිය

මාධ්‍යය—මෙම තරඟ විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(අ) අනිවාර්ය විෂයයන්—රචනය, සාරාංශය හා සාමාන්‍ය දැනීම අපේක්ෂකයින් විසින් මෙම විෂයයන් ගන්නා භාෂා මාධ්‍යය සඳහන් කළ යුතුය.

අපේක්ෂකයින් විසින් අනිවාර්ය විෂයයන්ට එක් භාෂා මාධ්‍යයකින් පමණක් පෙනී සිටිය යුතුය. අපේක්ෂකයින් විසින් අනිවාර්ය විෂයයන්ට පෙනී සිටින භාෂා මාධ්‍යය, ඔවුන් රාජ්‍ය සේවයට ඇතුළුවන භාෂා මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

(ආ) වෛකල්පික විෂයයන්—(i) යම් අපේක්ෂකයෙකු විසින් තෝරාගනු ලබන විෂයයන්, ඔහු/ඇය විසින් එය උපාධිය ලබා ගැනීමේදී සාමාර්ථය ලත් විෂයයක් වුවහොත් එම විෂයය උපාධිය සඳහා ගන්නා ලද භාෂා මාධ්‍යයෙන්ම ගත යුතුයි.

(ii) අන් සෑම විෂයයකදීම, ඒ ඒ විෂයයන් සඳහා පෙනී සිටීමට වඩාත් කැමති කුමන මාධ්‍යයකින්ද යන්න අනු පිළිවෙලින් දැක්විය යුතුයි. මෙම විෂයයන්ට පෙනී සිටීමේ මාධ්‍යය කොමිෂන් සභාව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇත.

මෙම විභාගයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ. එක් එක් විෂයය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය ඒ ඒ විෂයයට ඉදිරියෙන් දැක්වේ.

**"ඒ" කොටස—සියළුම අපේක්ෂකයන්ට අනිවාර්යය**

| | | ලකුණු |
|---|---|---|
| 1. | වාක්‍ය රචනය ... ... ... | 150 |
| 2. | සාරාංශය ... ... ... | 100 |
| 3. | සාමාන්‍ය දැනීම ... ... ... | 150 |

**"බී" කොටස—වෛකල්පික විෂයයන් සහ වාචික පරීක්ෂණය (සාමාන්‍ය)**

මුළු ලකුණු සංඛ්‍යාව 600ක් වන පරිදි මෙම කොටසෙහි දැක්වෙන වෛකල්පික විෂයයන් (4 සිට 62 දක්වා) අතුරෙන් සුදුසු විෂයයන් ගණනක් අපේක්ෂකයන් විසින් ගත යුතුය.

| | | | | ලකුණු |
|---|---|---|---|---|
| 4. | සිංහල | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 5. | සිංහල | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 6. | දෙමළ | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 7. | දෙමළ | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 8. | අරාබි | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 9. | අරාබි | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 10. | සංස්කෘත | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 11. | සංස්කෘත | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 12. | පාලි | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 13. | පාලි | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 14. | ඉංග්‍රීසි | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 15. | ඉංග්‍රීසි | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 16. | ලතින් | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |

| | | | | ලකුණු |
|---|---|---|---|---|
| 17. | ග්‍රීක් | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 18. | සම්භාවිත සාහිත්‍ය | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 19. | ප්‍රංශ භාෂාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 20. | ඉතිහාසය | පහළ කොටස | පත්‍ර හතරකින් දෙකක් | 200 |
| 21. | ඉතිහාසය | ඉහළ කොටස | පත්‍ර අටකින් හතරක් | 400 |
| 22. | ආර්ථික විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 23. | ආර්ථික විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර දහයකින් හතරක් | 400 |
| 24. | දේශපාලන විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 25. | දේශපාලන විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 26. | සමාජ විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 27. | සමාජ විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර පහකින් හතරක් | 400 |
| 28. | භූගෝල විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 29. | භූගෝල විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 30. | පුරා විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 31. | පුරා විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 32. | මානව විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 33. | බෞද්ධ සංස්කෘතිය | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 34. | බෞද්ධ සංස්කෘතිය | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 35. | දර්ශන ශාස්ත්‍රය | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 36. | දර්ශන ශාස්ත්‍රය | ඉහළ කොටස | පත්‍ර හයකින් හතරක් | 400 |
| 37. | ශුද්ධ ගණිතය | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 38. | ප්‍රායෝගික ගණිතය | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 39. | ගණිතය | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 40. | භෞතික විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 41. | භෞතික විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 42. | රසායන විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 43. | රසායන විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 44. | උද්භිද විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 45. | උද්භිද විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 46. | සත්ව විද්‍යාව | පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 47. | සත්ව විද්‍යාව | ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 48. | රාජ්‍ය පරිපාලන විද්‍යාව | | පත්‍ර කළුයි ... | 100 |
| 49. | රාජ්‍ය මූල්‍ය | | පත්‍ර එකයි ... | 100 |
| 50. | ව්‍යාපාර පරිපාලනය | | පත්‍ර එකයි ... | 100 |
| 51. | පරිපාලන විද්‍යා මූලධර්ම | | පත්‍ර එකයි ... | 100 |
| 52. | අලෙවි කිරීම | | පත්‍ර එකයි ... | 100 |
| 53. | අධ්‍යාපන මනෝ විද්‍යාව | | පත්‍ර දෙකයි ... | 200 |
| 54. | අධ්‍යාපනික මූලධර්ම | | පත්‍ර එකයි ... | 100 |
| 55. | තුලනාත්මක අධ්‍යාපනය | | පත්‍ර එකයි ... | 100 |
| 56. | පුද්ගල හා දේපල නීතිය | | පත්‍ර එකයි ... | 100 |
| 57. | බැඳීම් නීතිය | | පත්‍ර එකයි ... | 100 |
| 58. | රෝම නීතිය | | පත්‍ර එකයි ... | 100 |
| 59. | රාජ්‍ය විධි නීතිය | | පත්‍ර එකයි ... | 100 |
| 60. | ජාත්‍යන්තර නීතිය | | පත්‍ර එකයි ... | 100 |
| 61. | නීති විද්‍යාව හා නෛතික සිද්ධාන්තය | | පත්‍ර එකයි ... | 100 |
| 62. | අපරාධ නීතිය | | පත්‍ර එකයි ... | 100 |
| 63. | වාචික පරීක්ෂණය (සාමාන්‍ය) | | ... | 200 |

''සී'' කොටස—ලංකා විදේශ සේවා අපේක්ෂකයින් සඳහා අනිවාර්යයි

| | | | ලකුණු |
|---|---|---|---|
| 64. | ලෝක විත්ති | පත්‍ර එකයි ... | 100 |
| 65. | වාචික පරීක්ෂණය (විශේෂ) | ... | 150 |

**සංලක්ෂ්‍යය.**—(i) ස්වාභාවික විද්‍යා විෂයයන්ට (40 සිට 47 දක්වා විෂයයන්) පෙනී සිටින අපේක්ෂකයන් විශ්ව විද්‍යාල තත්ත්වයේ ආයතනයක රසායනාගාර පුහුණුවක් ලැබූ බවට එම ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කළ සහතිකයන් ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය.**—(ii) භූගෝල විද්‍යාව ගන්නා බාහිර හා පුද්ගලික අපේක්ෂකයන් තමන් විශ්ව විද්‍යාල තත්ත්වයේ ආයතනයක ප්‍රායෝගික පුහුණුවක් ලැබූ බවට එම ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය.**—(iii) ඒ ඒ විෂයය අරභයා අපේක්ෂකයන්ට දෙනු ලබන ලකුණු වලින් හුදු නොගැඹුරු දැනුමක් නිසා ලකුණු ලබාගැනීමට ඉඩ නොතබනු පිණිස අඩු කිරීම අවශ්‍ය වේ යයි පරීක්ෂකයින් විසින් සැලකෙන ලකුණු ප්‍රමාණයක් අඩු කරනු ඇත.

**සංලක්ෂ්‍යය.**—(iv) යම්කිසි අපේක්ෂකයකුගේ අත් අකුරු පහසුවෙන් කියවා ගැනීමට තරම් පැහැදිලි නොවේ නම් ඔහුට/ඇයට ලැබිය යුතු මුළු ලකුණු ප්‍රමාණයෙන් සැලකිය යුතු තරම් වූ ලකුණු ප්‍රමාණයක් ඒ සඳහා අඩු කරනු ඇත.

**සංලක්ෂ්‍යය.**—(v) භාෂාවට විශේෂයෙන් කැපවූ i වැනි විෂයය සම්බන්ධයෙන් පමණක් නොව විභාගයේ අන්‍ය සියලුම විෂයයන් සම්බන්ධයෙන්ද පිළිතුරු ලිවීමේදී වාග් බාහුල්‍යයෙන් තොරවූත් නිරවුල්වූත් ප්‍රාමාණවත් වූත් නිවැරදිවූත් බස් වහරට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—(vi) අපේක්ෂකයන් විසින් ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වාචික පරීක්ෂණ පවත්වන මණ්ඩලවලට දෙනු නොලැබේ.

මෙම විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ. රචනය, සාරාංශය සහ සාමාන්‍ය දැනීම යන අනිවාර්ය විෂයයන්ගෙන් සමන්විත වන මෙම විභාගයේ 'ඒ' කොටස පළමුව පවත්වනු ලැබේ. විභාගයේ 'ඒ' කොටසේ ප්‍රතිඵල අනුව, විභාගයේ 'බී' කොටස සඳහා පෙනී සිටීමට අවසර දෙනු ලබන අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව, ලංකා පරිපාලන සේවයෙහි පවතින ඇබෑර්තු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වනු ඇත. 'ඒ' කොටසේ ප්‍රතිඵල අනුව කුශලතා අනුපිළිවෙල මත එවැනි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

විභාගයේ 'බී' කොටස, ලකුණු 600 ක් නියමිත වෛකල්පික විෂයයන්ගෙන් හා ලකුණු 200 ක් නියමිත සාමාන්‍ය වාචික පරීක්ෂණයෙන් සමන්විත වෙයි. ලංකා විදේශ සේවය සඳහා ඇතුළුවන අපේක්ෂකයින්ට, සාමාන්‍ය වාචික පරීක්ෂණයට සහ වෛකල්පික විෂයයන්ට අමතරව, ලකුණු 100ක් නියමිත ලෝක විත්ති ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ලෝක විත්ති ප්‍රශ්න පත්‍රයෙන් සෑහෙන උසස් තත්ත්වයක් ලබාගන්නා අපේක්ෂකයින්, විශේෂ වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලංකා පරිපාලන සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ අවසාන කුශලතා අනු පිළිවෙල එම අයදුම්කරුවන් 'ඒ' සහ 'බී' යන කොටස් දෙකටම ලබා ගත් ලකුණු සැලකිල්ලට ගැනීමෙන්ද, ලංකා විදේශ සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ අවසාන කුශලතා අනුපිළිවෙල එම අයදුම්කරුවන් 'ඒ', 'බී' සහ 'සී' යන කොටස් වලට ලබාගත් ලකුණු සැලකිල්ලට ගැනීමෙන්ද තීරණය කරනු ලැබේ.

5–677—70.5.29 දින අංක 14,908 දරණ ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/102/47 (ජී).

## භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීමේ විභාගය—1969 මැයි

භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීම සඳහා 1969 මැයි මස 22 වැනි දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් තෝරාගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | | ලිපිනය |
|---|---|---|
| ආරියතිලක, පී. එස්. | ... | සමුපකාර කාර්යාලය, මාතලේ |
| කරුණාසේන, ජී. ඒ. | ... | ම/කපුගම විද්‍යාලය, දෙවුන්දර |
| මනම්පේරිගේ, ජේ. | ... | ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු තැනගේ කාර්යාලය, දුම්රිය දෙපාර්තමේන්තුව, රත්මලාන |
| සෝමසුන්තර අයියර්, එස්. | ... | තක්සේරු දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| වික්‍රමනායක, ජේ. සී. | ... | මැතිවරණ කාර්යාලය, කළුතර |

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1970 මැයි මස 16 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

5–617—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

## ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන තරඟ විභාගය—1970

ඊ. 1/70.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කරගැනීම සඳහා 1970 වර්ෂයේදී කොළඹ දී පැවැත්වෙන විභාගයේ රෙගුලාසි පොදු මහජනයාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.
කොළඹ,
1970 මැයි මස 8 වැනි දින.

### රෙගුලාසි මාලාව

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට බඳවා ගැනීම පිණිස විවෘත තරඟ විභාගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ. අනිවාර්‍ය විෂයයන්ගෙන් සමන්විත වන විභාගයේ '' ඒ '' කොටස පළමුව පවත්වනු ලබන අතර එය 1970 අගෝස්තු මස හෝ ඊට නුදුරු දිනක දී හෝ පවත්වනු ලැබේ. නියමිත දිනයන් පසුව දැනුම් දෙනු ලැබේ. විභාගයේ '' බී '' හා '' සී '' කොටස්, '' ඒ ' කොටසේ ප්‍රතිඵල ලැබුනාට පසුව පවත්වනු ලැබේ. '' බී '' හා '' සී '' කොටස් පවත්වනු ලබන දිනයන් පසුව දන්වනු ලැබේ. මෙම විභාගය පොදු යහපත තකා අවලංගු කළයුතු යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැඟී ගියහොත් එසේ අවලංගු කිරීමේ බලය එම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. එසේම මෙම විභාගය කල් දැමීම අවශ්‍ය යයි පෙනී ගිය විටක එසේ කල් දැමීමේ බලයද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත් වේ.

2. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ලංකා පරිපාලන සේවයේ සහ ලංකා විදේශ සේවයේ පුරවනු ලබන ඇබෑර්තු සංඛ්‍යාවත්, එම ඇබෑර්තු පුරවනු ලබන දිනයත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථා කාලයේදී තීරණය කරනු ලැබේ. තවද, මහජන යහපත තකා කළයුතු යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකතොත් පුරප්පාඩු කිසිවක් හෝ සියල්ලම හෝ නොපුරවා හැරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සියලු දෙනාම ලාංකිකයන් විය යුතුය. මෙම විභාගයේ පරමාර්ථයන් සඳහා ලාංකිකයෙකු යන්නෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු වන කෙනෙකි.

4. මෙම විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයින් 1970 අගෝස්තු මස 1 වැනි දිනට අවුරුදු 22කට නොඅඩුවූත් 27ට නොවැඩිවූත් අය විය යුතුය. (1969 වර්ෂයේ විභාගයක් නොපැවැත්වූ නිසා මෙම විභාගය සඳහා පමණක් ඉහළ වයස් සීමාව 27 දක්වා වැඩි කර ඇත.) රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන්ට ඉහත සඳහන් වයස් සීමාවන් අදාල වන්නේ නැත.

5. නියම කරන ලද සුදුසුකම් හිමි ස්ත්‍රී අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වන අතර පුරවනු ලබන ඇබෑර්තු සංඛ්‍යාවෙන් සියයට 20කට වැඩි ප්‍රමාණයක් ඔවුන් පත් කිරීමෙන් පුරවනු නොලැබේ.

6. විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය.

7. තමන් සෞඛ්‍ය තත්ත්වයෙන් හා චරිත ශුද්ධියෙන් යෝග්‍යයයන් බව අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තෘප්තියට හේතු වන පරිදි දක්විය යුතුය. තවද, ඔවුහු මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් හා හොඳට ඇස් පෙනීමෙන්ද දිවයිනේ කවර ප්‍රදේශයක වුවත් සේවය කිරීමට යෝග්‍ය කාය බලයකින්ද යුක්ත විය යුත්තෝය. විභාගයෙන් සමත්වන අපේක්ෂකයින්ට තමන් මෙකී කරුණු අතින් යෝග්‍යයයන් දැයි පරීක්ෂා කර බැලීම සඳහා පැවැත්වෙන දැඩි සෞඛ්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ඇත.

8. විවාහක අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් වේ නම් ඔහු/ඇ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය නොමැතිව පත්වීමක් දෙනු ලැබීමට යෝග්‍යයයන් වන්නේ නැත.

9. විභාගය සඳහා ගෙවිය යුතු ගාස්තුව පිළිබඳ විස්තර මෙසේය :—

(අ) '' ඒ '' කොටස—රු. 100කි. එම මුදල ඉල්ලුම් පත්‍ර භාරගන්නා අන්තිම දිනයට කලින් 6 වැනි අය භාර ශීර්ෂයේ 3 වැනි උප ශීර්ෂයේ (4) විෂයයට බැර කොට ළඟම පිහිටි කච්චේරියට හෝ කොළඹ මහා භාණ්ඩාගාරයට හෝ ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා කච්චේරියෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් හෝ ලබාගත් කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයේ අවසාන පිටුවේ අලවා එවිය යුතුය.

(ආ) '' බී '' හා '' සී '' කොටස්—රු. 100කි. විභාගයේ '' බී '' හා '' සී '' කොටස්වලට පෙනී සිටීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින්ට මෙම ගාස්තුව ගෙවිය යුතු අන්දම ගැන පසුව දන්වනු ලැබේ.

සටහන.—විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබුවහොත් අපේක්ෂකයින් විසින් ගෙවූ සම්පූර්ණ විභාග ගාස්තු ඔවුන්ට ආපසු ගෙවනු ලැබේ. විභාගයට පෙනී සිටීමට අවසර දීමෙන් පසුව කවර අවස්ථාවක කවර හේතුවක් නිසාවත්, විභාගයෙන් ඉල්ලා අස්වන හෝ විභාගයට පෙනී නොසිටින අපේක්ෂකයින්ට තමන් ගෙවූ විභාග ගාස්තුව සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ආපසු ලබාගැනීමට අයිතියක් නොමැතිය.

(ඇ) වෛද්‍ය පරීක්ෂණය සඳහා ගෙවිය යුතු ගාස්තුව රු. 10·50කි. මෙම ගාස්තුව ගෙවිය යුත්තේ කෙසේදැයි සමත්වූ අපේක්ෂකයින්ට පසුව දන්වනු ඇත.

10. (අ) තරඟ විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලබන්නේ, පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව හෝ සාමාන්‍ය උපාධි විභාගයකින් හෝ නැතහොත් යටත් පිරිසෙයින් තත්ත්වයෙන් එම විභාගයට සමානවූ වෙනත් විභාගයකින් සමත්වූ අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට පමණකි.

(ආ) වාචික පරීක්ෂණයට ප්‍රථමයෙන් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් ස්වකීය උපාධි සහතික ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ඉහත සඳහන් සුදුසුකම් සතු අපේක්ෂක/අපේක්ෂිකාවන්ට පමණක් ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ සහ ලංකා විදේශ සේවයේ ඇබෑර්තු සඳහා තරඟ කළ හැකිය. ලංකා පරිපාලන සේවය සහ ලංකා විදේශ සේවය අතුරෙන් තමන් වඩා කැමති සේවය, අපේක්ෂකයින් විසින් අයදුම් පතෙහි 18 වැනි ඡෙදයෙහි සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පසු, සඳහන් කර ඇති කැමැත්තේ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. **ඉල්ලුම් කළ යුතු අන්දම.**—(අ) අයදුම්පත් පෝර්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් 1970 ජූනි මස 1 වැනි දින සිට 1970 ජූනි මස 25 වැනි දින දක්වා ලබාගත යුතුය. අයදුම් පත්‍ර පෝර්ම ඉල්ලුම් කරන විට අයදුම්කරුවන් විසින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ තම ලිපිනය ලියන ලද, මුද්දර නොගැසූ ලියුම් කවරයක් එවිය යුතුය. අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ තැපෑලෙන් පමණි. පුද්ගලිකව මෙම කාර්‍යාලයට පැමිණ අයදුම්පත් ලබාගත නොහැකිය.

(ආ) අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැපැල් පෙට්ටිය අංක 500, කොළඹ, යන ලිපිනයට 1970 ජූනි මස 29 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර, පාලන රෙගුලාසි 109 ප්‍රකාර, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අයදුම්පත් සියලු ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතුය. ඉල්ලා ඇති සියලුම තොරතුරු සපයා නොමැති නම්, ඉල්ලුම් පත්‍රය එහි සඳහන් කර ඇති තොරතුරු අනුව තීරණය කොට ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(ඈ) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතු වේ.

(ඊ) අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත් පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ( ' ඒ '' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත් එහි සඳහන් කර ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මෙම කායර්‍යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සලකා බැලීම සම්බන්ධ ඔහුට ඇති අයිතිය අහිමි වේ.

12. විභාගයට පෙනී සිටීමට අනුමැතිය දීම පිළිබඳ සලකා බලනුයේ ඉල්ලුම්පත් ලැබීමෙන් පසුවය.

13. විවෘත තරඟ විභාගය සඳහා කිසිම අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට දෙවතාවකට වඩා පෙනී සිටිය නොහැක.

14. විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබූ සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ.

15. **හැඳුනුම් පත්.**—අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයන් සඳහා විභාග ශාලාවේදී පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් කවරක් හෝ පිළිගනු ඇත :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් ;

(ආ) මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද වලංගු ගමන් ප්‍රවේශ පත්‍රයක් ;

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරය පිට මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද දරන්නාගේ ඡායාරූපය අඩංගු කිසියම් සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන් කිසි ලියවිල්ලක්.

16. **වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම්.**—මේ විභාගයට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙක් ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හා ඊට පසු යන කවර අවස්ථාවකදී වුව ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් ඔහුගේ දැනුම පරිදි වැරදි බව පෙනී යන ලද නම් හෝ ඔහු විසින් සවධ්‍යානයෙන්ම කිසියම් වැදගත් කාරණයක් වසන කරන ලද නම් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වනු ඇත.

17. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයෙහි ආරම්භයේ පළ කොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසි කෙරෙහි ඉල්ලුම්කරුවන්ගේ සැළකිල්ල යොමු කරවනු ලැබේ.

### ලංකා පරිපාලන සේවයේ V වැනි පංක්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීමේ විවෘත තරඟ විභාගය

### විභාග පරිපාටිය

**මාධ්‍යය.**—මෙම තරඟ විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(අ) **අනිවාය්‍ර්‍ය විෂයයන්.**—රචනය, සාරාංශය හා සාමාන්‍ය දැනීම—අපේක්ෂකයින් විසින් මෙම විෂයයන් ගන්නා භාෂා මාධ්‍යය සඳහන් කළ යුතුය.

අපේක්ෂකයින් විසින් අනිවාය්‍ර්‍ය විෂයයන්ට එක් භාෂා මාධ්‍යයකින් පමණක් පෙනී සිටිය යුතුය. අපේක්ෂකයින් විසින් අනිවාය්‍ර්‍ය විෂයයන්ට පෙනී සිටින භාෂා මාධ්‍යය, ඔවුන් රාජ්‍ය සේවයට ඇතුළු වන භාෂා මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

(ආ) **වෛකල්පික විෂයයන්.**—(i) යම් අපේක්ෂකයෙකු විසින් තෝරා ගනු ලබන විෂයයන්, ඔහු/ඇය විසින් එය උපාධිය ලබාගැනීමේදී සාමාර්ථය ලත් විෂයයක් වුවහොත් එම විෂයය උපාධිය සඳහා ගන්නා ලද භාෂා මාධ්‍යයෙන්ම ගත යුතුයි.

(ii) අන් සැම විෂයයකදීම, ඒ ඒ විෂයයන් සඳහා පෙනී සිටීමට වඩාම කැමති කුමන මාධ්‍යයකින්ද යන්න අනු පිළිවෙලින් දැක්විය යුතුයි. මෙම විෂයයන්ට පෙනී සිටීමේ මාධ්‍යය කොමිෂන් සභාව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇත.

මෙම විභාගයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ. එක් එක් විෂයය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය ඒ ඒ විෂයයට ඉදිරියෙන් දැක්වේ.

**'' ඒ '' කොටස—සියලුම අපේක්ෂකයන්ට අනිවාය්‍ර්‍යය**

| | | | | | ලකුණු |
|---|---|---|---|---|---|
| 1. | වාක්‍ය රචනය | ... | ... | ... | 150 |
| 2. | සාරාංශය | ... | ... | ... | 100 |
| 3. | සාමාන්‍ය දැනීම | ... | ... | ... | 150 |

**'' බී '' කොටස—වෛකල්පික විෂයයන් සහ වාචික පරීක්ෂණය (සාමාන්‍ය)**

මුළු ලකුණු සංඛ්‍යාව 600ක් වන පරිදි මෙම කොටසෙහි දැක්වෙන වෛකල්පික විෂයයන් (4 සිට 62 දක්වා) අතුරෙන් සුදුසු විෂයයන් ගණනක් අපේක්ෂකයන් විසින් ගත යුතුය :—

| | | | | | | | | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| 4. | සිංහල | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 5. | සිංහල | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 6. | දෙමළ | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 7. | දෙමළ | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 8. | අරාබි | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 9. | අරාබි | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 10. | සංස්කෘත | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 11. | සංස්කෘත | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 12. | පාලි | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 13. | පාලි | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 14. | ඉංග්‍රීසි | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 15. | ඉංග්‍රීසි | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 16. | ලතින් | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 17. | ග්‍රීක් | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 18. | සම්භාවිත සාහිත්‍ය | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර හතරයි | ... | 400 |
| 19. | ප්‍රංශ භාෂාව | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |
| 20. | ඉතිහාසය | ... | ... | ... | පහළ කොටස | පත්‍ර හතරකින් දෙකක් | ... | 200 |
| 21. | ඉතිහාසය | ... | ... | ... | ඉහළ කොටස | පත්‍ර අටකින් හතරක් | ... | 400 |
| 22. | ආර්ථික විද්‍යාව | ... | ... | ... | පහළ කොටස | පත්‍ර දෙකයි | ... | 200 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ලකුණු |
| 23. | ආර්ථික විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර දහයකින් හතරක් ... | 400 |
| 24. | දේශපාලන විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 25. | දේශපාලන විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 26. | සමාජ විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 27. | සමාජ විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර පහකින් හතරක් ... | 400 |
| 28. | භූගෝල විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 29. | භූගෝල විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 30. | පුරා විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 31. | පුරා විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 32. | මානව විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 33. | බෞද්ධ සංස්කෘතිය ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 34. | බෞද්ධ සංස්කෘතිය ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 35. | දර්ශන ශාස්ත්‍රය ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 36. | දර්ශන ශාස්ත්‍රය ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හයකින් හතරක් ... | 400 |
| 37. | ශුද්ධ ගණිතය ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 38. | ප්‍රායෝගික ගණිතය ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 39. | ගණිතය ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 40. | භෞතික විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 41. | භෞතික විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 42. | රසායන විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 43. | රසායන විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 44. | උද්භිද විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 45. | උද්භිද විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 46. | සත්ව විද්‍යාව ... | ... | ... පහළ කොටස | පත්‍ර දෙකයි ... | 200 |
| 47. | සත්ව විද්‍යාව ... | ... | ... ඉහළ කොටස | පත්‍ර හතරයි ... | 400 |
| 48. | රාජ්‍ය පරිපාලන විද්‍යාව | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 49. | රාජ්‍ය මූල්‍ය ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 50. | ව්‍යාපාර පරිපාලනය | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 51. | පරිපාලන විද්‍යා මූලධර්ම | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 52. | අලෙවි කිරීම ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 53. | අධ්‍යාපන මනෝ විද්‍යාව | ... | ... | පත්‍ර දෙකයි ... | 200 |
| 54. | අධ්‍යාපනික මූලධර්ම | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 55. | තුලනාත්මක අධ්‍යාපනය | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 56. | පුද්ගල හා දේපල නීතිය | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 57. | බැඳීම් නීතිය ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 58. | [illegible]ර්ම නීතිය ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 59. | රාජ්‍ය විධි නීතිය ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 60. | ජාත්‍යන්තර නීතිය ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 61. | නීති විද්‍යාව හා නෛතික සිද්ධාන්තය | | ... | පත්‍ර එකයි ... | 100 |
| 62. | අපරාධ නීතිය ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 63. | වාචික පරීක්ෂණය (සාමාන්‍ය) | ... | ... | ... | 200 |

" සී " කොටස—ලංකා විදේශ සේවා අපේක්ෂකයින් සඳහා අනිවාර්යයි

| | | | | | |
|---|---|---|---|---|---|
| 64. | ලෝක විත්ති ... | ... | ... | පත්‍ර එකයි ... | 100 |
| 65. | වාචික පරීක්ෂණය (විශේෂ) | ... | ... | ... | 150 |

සංලක්ෂ්‍යය.—(i) ස්වාභාවික විද්‍යා විෂයයන්ට (40 සිට 47 දක්වා විෂයයන්) පෙනී සිටින අපේක්ෂකයන් විශ්ව විද්‍යාල තත්ත්වයේ ආයතනයක රසායනාගාර පුහුණුවක් ලැබූ බවට එම ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

සංලක්ෂ්‍යය.—(ii) භූගෝල විද්‍යාව ගන්නා බාහිර හා පුද්ගලික අපේක්ෂකයන් තමන් විශ්ව විද්‍යාල තත්ත්වයේ ආයතනයක ප්‍රායෝගික පුහුණුවක් ලැබූ බවට එම ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

සංලක්ෂ්‍යය.—(iii) ඒ ඒ විෂයය අරභයා අපේක්ෂකයන්ට දෙනු ලබන ලකුණුවලින් හුදු නොගැඹුරු දැනුමක් නිසා ලකුණු ලබාගැනීමට ඉඩ නොතබනු පිණිස අඩු කිරීම අවශ්‍ය වේ යයි පරීක්ෂකයින් විසින් සැලකෙන ලකුණු ප්‍රමාණයක් අඩු කරනු ඇත.

සංලක්ෂ්‍යය.—(iv) යම්කිසි අපේක්ෂකයකුගේ අත් අකුරු පහසුවෙන් කියවා ගැනීමට තරම් පැහැදිළි නොවේ නම් ඔහුට/ඇයට ලැබිය යුතු මුළු ලකුණු ප්‍රමාණයෙන් සැලකිය යුතු තරම්වූ ලකුණු ප්‍රමාණයක් ඒ සඳහා අඩු කරනු ඇත.

සංලක්ෂ්‍යය.—(v) භාෂාවට විශේෂයෙන් කැපවූ 1 වැනි විෂයය සම්බන්ධයෙන් පමණක් නොව විභාගයේ අන්‍ය සියලුම විෂයයන් සම්බන්ධයෙන්ද පිළිතුරු ලිවීමේදී වාග් බාහුල්‍යයෙන් තොරවූත් නිරවුල්වූත් ප්‍රාණවත්වූත් නිවැරදිවූත් බස් වහරට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

සංලක්ෂ්‍යය.—(vi) අපේක්ෂකයන් විසින් ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වාචික පරීක්ෂණ පවත්වන මණ්ඩලවලට දෙනු නොලැබේ.

මෙම විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ. රචනය, සාරාංශය සහ සාමාන්‍ය දැනීම යන අනිවාර්ය විෂයයන්ගෙන් සමන්විත වන මෙම විභාගයේ " ඒ " කොටස පළමුව පවත්වනු ලැබේ. විභාගයේ " ඒ " කොටසේ ප්‍රතිඵල අනුව, විභාගයේ " බී " කොටස සඳහා පෙනී සිටීමට අවසර දෙනු ලබන අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව, ලංකා පරිපාලන සේවයෙහි පවතින ඇබෑර්තු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වනු ඇත. " ඒ " කොටසේ ප්‍රතිඵල අනුව කුශලතා අනුපිළිවෙල මත එවැනි අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

විභාගයේ " බී " කොටස, ලකුණු 600ක් නියමිත වෛකල්පික විෂයයන්ගෙන් හා ලකුණු 200ක් නියමිත සාමාන්‍ය වාචික පරීක්ෂණයෙන් සමන්විත වෙයි. ලංකා විදේශ සේවය සඳහා ඇතුළුවන අපේක්ෂකයින්ට, සාමාන්‍ය වාචික පරීක්ෂණයට සහ වෛකල්පික විෂයයන්ට අමතරව, ලකුණු 100ක් නියමිත ලෝක විත්ති ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ලෝක විත්ති ප්‍රශ්න පත්‍රයෙන් සෑහෙන උසස් තත්ත්වයක් ලබාගන්නා අපේක්ෂකයින්, විශේෂ වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලංකා පරිපාලන සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ අවසාන කුශලතා අනුපිළිවෙල එම අයදුම්කරුවන් " ඒ " සහ " බී " යන කොටස් දෙකටම ලබාගත් ලකුණු සැළකිල්ලට ගැනීමෙන්ද, ලංකා විදේශ සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ අවසාන කුශලතා අනුපිළිවෙල එම අයදුම්කරුවන් " ඒ ", " බී " සහ " සී " යන කොටස්වලට ලබාගත් ලකුණු සැළකිල්ලට ගැනීමෙන්ද තීරණය කරනු ලැබේ.

## නිර්දේශ මාලාව

**විශේෂයෙන් සඳහන් කොට නැතිනම් සෑම ප්‍රශ්න පත්‍රයකටම නියමිත කාලසීමාව පැය තුනකි**

**" අ " කොටස—සියළුම අපේක්ෂකයින්ට අනිවාර්‍ය්‍ය**

1. **වාක්‍ය රචනය.**—නියම කරන ලද විෂයයන් 4ක් හෝ 5ක් අතරින් එකක් තෝරා ගෙන රචනය ලිවීම, විශේෂ උගෙනීම් ක්ෂෙත්‍රයකට මේ රචනා විෂයයන් සම්බන්ධිත නොවන අතර ඒ සම්බන්ධිතවනුයේ අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනීම හා ඥානය, ප්‍රකාශ කිරීමට හා සිතීමට ඇති හැකියාව පරීක්ෂණයට භාජනය කරනු සඳහාය. වාක්‍ය රචනයේ තත්ත්වය විසඳනවා ඇත්තේ තමා තෝරා ගත් මාතෘකා පැහැදිලි කිරීමේදී අනුගමනය කරන කල්පනා ශක්තිය හා නිවහල් භාවය අනුව මෙන්ම එහි භාෂා විලාශය, ශෛලිය හා සකස් කිරීම අනුවය. මෙය පැහැදිලිව මෙන්ම කියවිය හැකිසේ ලිවිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—(ඒ) මාතෘකාවට එකහතාවය හා (බී) පැහැදිලි භාවය වෙත ඇති අගය කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. ලිවීම් ආරම්භ කරන්නට ප්‍රථමයෙන් විෂය ගැන සිතා මතා එහි ඇතුලත් විය යුතු දේ හා එහි අවශ්‍යතාවය ගැනද සිතිය මනාය. විෂය සුපරික්ෂාකාරීව විභාග කර බැලීම කල්පනා කිරීමේ තත්ත්වය හා ලියන දේ සම්බන්ධයෙන් විශේෂතාවයක් දක්වනු ලැබේ.

2. **සාරාංශය.**—මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය එක් පැයකි. මෙහි ලා අපේක්ෂකයන් විසින් කළ යුත්තේ ප්‍රශ්න පත්‍රයට ඇතුළත් ගද්‍ය පාඨයෙහි හෝ පාඨකිහිපයෙහි ගැබ වූ අදහස් වඩාත් සම්පිණ්ඩනය කොට දැක්වීමය.

3. **සාමාන්‍ය දැනීම.**—වර්තමානයෙහි සංස්කෘතික, සාමාජික, ආර්ථික, දේශපාලනමය හා විද්‍යාත්මක විෂයයන් සම්බන්ධයෙන් පොදු වැදගත්කමින් යුතු කරුණු පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රයකි. අපේක්ෂකයන්ට තමන් කැමති ප්‍රශ්න පමණක් තෝරා ගැනීමට හැකි වන අයුරින් මෙම ප්‍රශ්න පත්‍රයට ප්‍රශ්න රාශියක් ඇතුළත් වෙනු ඇත.

**" අ " කොටස—වෛකල්පික විෂයයන් හා වාචික පරීක්ෂණය (සාමාන්‍ය)**

4. **සිංහල (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—12 වැනි සිය වසෙහි සිට අද දක්වා ලියවුණු ගද්‍යමය ගැටපද සන්න, නිඝණ්ඩු හා පැරණි ගී කාව්‍ය දහැර අන්‍ය සිංහල ග්‍රන්ථ ; මෙම ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් කොටස් ලිඛිල් බසින් ලිවීම හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න ද ඇතුළත් වේ.

12 වැනි සියවසේ සිට නූතන සමය දක්වා සිංහල සාහිත්‍යයේ ඉතිහාසය සංක්ෂෙපයෙන් ; ගද්‍ය රචනය.

5. **සිංහල (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—සිංහල සෙල් ලිපි : සීගිරි පවුරු ලිපි : ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ. මෙම ග්‍රන්ථයන්ගෙන් උපුටාගත් කොටස් ලිඛිල් බසින් ලිවීම හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න ද ඇතුළත් වේ.

වාක්‍ය රචනයක් ; ඉංග්‍රීසියෙන් සිංහලට හා සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; සාහිත්‍ය විචාරය.

ආදිම කාලයේ සිට අද දක්වා සිංහල සාහිත්‍යයේ ඉතිහාසය ; සිංහල භාෂාවේ ඉතිහාසය.

ආගමෙහි හා (චිත්‍ර, මූර්ති හා නිර්මාණ) කලාවෙහි දියුණුව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව සිංහලයින්ගේ සංස්කෘතිය හා සභ්‍යත්වය.

6. **දෙමළ (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—මධ්‍යම කාලීන හා නූතන ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් කොටස් පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණුද පිළිබඳ ප්‍රශ්න.

ආදිම කාලයේ සිට ද්‍රවිඩ සාහිත්‍යයේ ඉතිහාසය ; ගද්‍ය රචනය.

7. **දෙමළ (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—දෙමළ සෙල් ලිපිවලින් හා පැරණිතම දෙමළ ග්‍රන්ථවලින් උපුටා ගත් කොටස් පරිවර්තනය කිරීම, සාහිත්‍ය විචාරය, දෙමළ භාෂා ඉතිහාසය ; ඡන්දෝලංකාර හා කාව්‍ය ශාස්ත්‍රය.

ද්‍රවිඩ වර්ගයා පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව ආදිම යුගයේ සිට 19 වැනි සියවසේ අවසානය දක්වා ද්‍රවිඩ සභ්‍යත්වයේ ඉතිහාසය.
මුල් කෘතීන් ආශ්‍රයෙන් ගෙනහැර දක්වන සාධකවලට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

8. **අරාබි (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—පශ්චාත් ඉස්ලාමීය යුගයට අයත්වූත් නූතන යුගයට අයත්වූත් අරාබි පොත්වලින් උපුටා ගත් කොටස් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ; ඒවායේ අන්තර්ගත කරුණු හා ව්‍යාකරණ පිළිබඳ ප්‍රශ්න.

අරාබි භාෂාමය ගද්‍ය රචනය ; අරාබි සාහිත්‍යයේ ඉතිහාසය.

9. **අරාබි (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—සප්ත මුඑල්ලක්වාත් ද ඇතුළු පූර්ව ඉස්ලාමීය, අපර ඉස්ලාමීය හා මධ්‍යතන යුගයේ ග්‍රන්ථවලින් උපුටා ගත් කොටස් පරිවර්තනය ; ඒවායේ ව්‍යාකරණ විධීන් පිළිබඳ ප්‍රශ්න.

අරාබි සාහිත්‍යයේ ඉතිහාසය හා දෙන ලද මාතෘකා කිහිපයක් අතුරෙන් එකක් අනුව අරාබි භාෂාවෙන් රචනයක් ලිවීම ; කාව්‍ය ශාස්ත්‍රය හා මාත්‍ර ලකුණු කිරීම.

ඉස්ලාමීය සභ්‍යත්වය.

සෙමිටික් ආගම් ඉතිහාසය ; දේවකථා හා පූර්ව ඉස්ලාමීය අරාබියානු චින්තනය පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව.

මූල කෘති ආශ්‍රයෙන් දක්වන සාධකයන්ට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

10. **සංස්කෘත (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—වෛදික හා පැරණි සංස්කෘත සාහිත්‍ය කෘතිවලින් උපුටා ගත් සරල කොටස් පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

සංස්කෘත සාහිත්‍යය ඉතිහාසය, ඡන්දෝලංකාර හා කාව්‍ය ශාස්ත්‍රය හා දේවනාගරී අකුරෙන් ගද්‍ය රචනය.

11. **සංස්කෘත (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—දර්ශනික හා ප්‍රාවෛදික සාහිත්‍ය කෘතීන්ද ඇතුළු වෛදික හා පැරණි සංස්කෘත ග්‍රන්ථවලින් උපුටා ගත් දුෂ්කර තත්ත්වයේ පාඨයන් පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

දෙන ලද මාතෘකා කිහිපයක් අතුරෙන් එකක් අනුව රචනයක් ලිවීම. තරමක් දුෂ්කර ඡේදයක් සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම හෝ පද්‍ය රචනය. රචනයක් ලිවිය යුත්තේ දේවනාගරී අකුරෙනි.

වෛදික, දර්ශනික හා ප්‍රාවෛදික සාහිත්‍යයේ ඉතිහාසය හා වෛදික යුගයේ පුරාවස්තු ; මේ හා සම්බන්ධ පුරා විද්‍යාත්මක සොයාගැනීම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ.

ඉන්දියානු ආගම, දේවකථා, දර්ශනවාදය හා ඉන්දියා චින්තාවේ ඉතිහාසය ආරම්භයේ සිට ක්‍රි. ව. 1200 පමණ දක්වා.

මූලාශ්‍රයන් පිළිබඳ දැනුමට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

12. **පාලි (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—ප්‍රකරණ සාහිත්‍යය හැර පිටක සාහිත්‍යයෙන් හා පශ්චාත්පිටක සාහිත්‍යයෙන් ද උපුටාගත් සරල කොටස් පරිවර්තනය ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

ගද්‍ය රචනය, ලංකාවේ පාලි සාහිත්‍යයේ ඉතිහාසය හා ලංකාවේ බෞද්ධ ඉතිහාසය.

13. **පාලි (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—අභිධර්ම හා ප්‍රකරණ සාහිත්‍යයද ඇතුළු වඩාත් දුෂ්කර පිටක සාහිත්‍ය කෘතීන්ගෙන් උපුටා ගත් පාඨ පරිවර්තනය කිරීම ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු, ව්‍යාකරණය හා වාග් විද්‍යාවද පිළිබඳ ප්‍රශ්න ; තත්කාලීන ඉන්දීය දර්ශනවාදය හා සම්බන්ධකොට බෞද්ධ ධර්මය පිළිබඳව ලබාගත් දැනුමක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තුවනු ලැබේ.

නියමිත මාතෘකා කිහිපයක් අතුරෙන් එකක් අනුව වාක්‍ය රචනයක් ලිවීම හෝ ඒ වෙනුවට සුදුසු ග්‍රන්ථයකින් උපුටා ගත් කොටසක් පාලි ගද්‍යයට හෝ පද්‍යයට නැඟීම.

පාලි සාහිත්‍යයේ ඉතිහාසය හා පුරාවස්තු ; බෞද්ධ චින්තනයේ ඉතිහාසය ; මහායානය පිළිබඳ සංක්ෂිප්ත දැනුමක් අවශ්‍යය.

මූල කෘතීන් පිළිබඳ දැනුමට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

14. **ඉංග්‍රීසි (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—ෂේක්ස්පියර්, ඩ්‍රයිඩන්, පෝප්, ආචාර්ය ජොන්සන්, බ්ලේක්, වර්ඩ්ස්වර්ත්; ජේන් ඔස්ටන්, කීට්ස් යන ලේඛකයන් පිළිබඳ විශේෂ අවධානයකින් යුතුව 1600 සිට 1832 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය.

ටෙනිසන්, ආර්නෝල්ඩ්, තෝමස් හාඩි, ෂෝ, කොන්රඩ්, ටී. එස්. එලියට්, ඩී. එච්. ලෝරන්ස්, යන ලේඛකයින් අතුරෙන් සිව් දෙනෙකු පිළිබඳ විශේෂ අවධානය කින් යුතුව 1832 සිට නූතන කාලය දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය.

විශේෂ අවධානයකින් යුතුව උගත යුතු ලෙස දක්වා ඇති ලේඛකයින්ගේ කෘතීන් සියල්ලම පිළිබඳ සවිස්තර දැනුමක් හෝ ඔවුන්ගේ කෘතිවලින් උපුටා ගත් කොටස් වෙන්කොට හඳුනා ගැනීමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තුවනු නොලැබේ. නිදසුනක් වශයෙන් ෂේක්ස්පියර්ගේ කෘති යනු වෙන් අදහස් කෙරෙනුයේ ඔහු ලියූ විවිධ ස්වරූපයේ කෘතීන් අතර වඩාත් ප්‍රකට වූ විශේෂ ලක්ෂණ සහිත කෘතීන් පිළිබඳ දැනුමක් ; උදා: සුඛාන්ත කෘති අතුරෙන් As You Like It ද, දුක්ඛාන්ත කෘති අතුරෙන් King Lear ද පසු කාලයේ ලියූ නාට්‍ය කෘතීන් අතුරෙන් The Tempest ද ආදි වශයෙනි. විශේෂයෙන් හදළ යුතු සේ නියමිත ලේඛකයන්ගේ කෘතීන් සම්බන්ධයෙන් අපේක්ෂකයින් විසින් ලියන පිළිතුරුවලට එම ලේඛකයන්ගේ ප්‍රධාන කෘතීන්ගෙන් තෝරා ගත් කොටස් ද නිදසුන් වශයෙන් උපුටා දැක්විය යුතුය. පහළ කොටසට ඇතුළත්වන, පොදුවේ දළ වශයෙන් බෙදුණු පූර්වෝක්ත යුග දෙකෙහි සාහිත්‍යයේ දියුණුව පිළිබඳ දැනුමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තුවනු නොලැබේ. එසේ වුවද තමන් කෙරෙහි භාෂාව පිළිබඳ මනා පරිචයක් ඇති බැව් ස්වකීය පිළිතුරු මගින් විදහා දැක්වීමක් ඔවුන්ගෙන් බලාපොරොත්තුවනු ලැබේ.

15. **ඉංග්‍රීසි (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—චෝසර්, ස්පෙන්සර්, ෂේක්ස්පියර්, බෙන් ජොන්සන්, ඩොන්, මිල්ටන්, වෙබ්ස්ටර් යන මොවුන් පිළිබඳ විශේෂ අවබෝධයකින් යුතුව 1550—1660 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය.

1660 සිට 1798 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය—ඩ්‍රයිඩන්, පෝප්, ස්විෆ්ට්, ඇඩිසන්, ආචාර්ය ජොන්සන්, ෆීල්ඩින්ං, බර්ක් යන මොවුන් පිළිබඳ විශේෂ අවබෝධයක් අවශ්‍ය වේ.

1798 සිට 1880 දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය—වර්ඩ්ස්වර්ත්, කීට්ස්, ෂෙලි, ජේන් ඔස්ටන්, ටෙනිසන්, ආර්නෝල්ඩ්, ඩිකන්ස් යන මොවුන් ගැන විශේෂ අවබෝධයක් අපේක්ෂා කරනු ලැබේ.

1880 සිට අද දක්වා ඉංග්‍රීසි සාහිත්‍යය—හොප්කින්ස්, ෂෝ, කොන්රඩ්, ජොයිස්, ඩී. එච්, ලෝරන්ස්, ඊ. ඇම්. පෝර්ස්ටර්, ටී. ඇස්. එලියට් යන මොවුන් පිළිබඳ විශේෂ අවබෝධයක් අවශ්‍ය වේ.

විශේෂයෙන් උගත යුතු සේ ඉහතින් තෝරා දක්වුණු කොටස් එක එකකින් යටත් පිරිසෙයින් ලේඛකයන් සිව් දෙනෙකු ගැනවත් විශේෂ දැනුමක්ද එසේම එකී එක් එක් ලේඛකයාගේ කෘතීන්ගෙන් උපුටා ගත් කොටස් හඳුනාගැනීමට හා විවේචනය කිරීමට ඇති දක්ෂතාව පරීක්ෂා කරනු පිණිස දෙනු ලබන අනිවාර්ය ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමක් (අන්‍ය ප්‍රශ්නවලට වැඩියෙන් මෙම ප්‍රශ්නයට ලකුණු දෙනු ලැබේ.) අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තුවනු ලැබේ. උගත යුතු සේ නියමිත එක් එක් සාහිත්‍ය යුගයෙක මූලික සාහිත්‍ය ප්‍රවීණතාවයන්ගෙන් එකක විශේෂ ලක්ෂණ ප්‍රකට කොට දක්වෙන පාඨයක් අසුරු කොට ගෙන පිළිතුරු ලිවිය යුතු ප්‍රායෝගික විචාරය පිළිබඳ ප්‍රශ්නයක්ද ඇතුළත් වේ. එම සාහිත්‍යය යුගයෙහි සාමාජික හා සාහිත්‍යයික පසුබිම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය සේ සලකනු ලැබේ. මෙම විෂය ගන්නා අපේක්ෂකයන් ඉංග්‍රීසි භාෂා විෂයෙහිලා මනා පරිචයක් තමන් සතුව ඇති බවද එම සාහිත්‍යයේ ප්‍රධාන කෘතීන් සූපරීක්ෂාවෙන් කියවා ඇති බවටද සාක්ෂ්‍ය ප්‍රකට කළ යුතුය.

16. **ලතින් (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—ලතින් පොත්වලින් උපුටා ගත් අනියමිත කොටස් පරිවර්තනය ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

ගද්‍ය රචනය හා ලතින් සාහිත්‍යයේ ඉතිහාසය.

17. **ග්‍රීක් (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—ග්‍රීක් පොත්වලින් උපුටාගත් අනියමිත කොටස් පරිවර්තනය ; ඒවායේ භාෂාව හා අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රශ්න.

ගද්‍ය රචනය හා ග්‍රීක සාහිත්‍යයේ ඉතිහාසය.

18. **සම්භාවිත පුරාණ සාහිත්‍ය (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—ග්‍රීක් පොත්වලින් උපුටා ගත් දුෂ්කර තත්ත්වයේ අනියමිත කොටස් පරිවර්තනය හා ග්‍රීක බසින් ගද්‍ය හා/හෝ පද්‍ය රචනය (ප්‍රශ්න පත්‍ර 1යි).

ලතින් පොත්වලින් උපුටා ගත් දුෂ්කර තත්ත්වයේ අනියමිත කොටස් පරිවර්තනය හා ලතින් බසින් ගද්‍ය හා/හෝ පද්‍ය රචනය (ප්‍රශ්න පත්‍ර 1 යි).

ග්‍රීක හා රෝම සභ්‍යත්වයේ ඉතිහාසය, සාහිත්‍යය, භූගෝල විද්‍යාව හා සාමාජික, දේශපාලනික, සාමජික හා දර්ශනික දියුණුව (ප්‍රශ්න පත්‍ර 2යි).

රෝම ඉතිහායයෙහි ලා ක්‍රි. පූ. 133 සිට ක්‍රි. පූ. 43 දක්වා කාල පරිච්ජෙදයත්, ලතින් සාහිත්‍ය විෂයෙහි ලා සිසරෝනියානු හා ඔගස්තීනු යුගයත් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත. ග්‍රීක ඉතිහාසය විෂයෙහි කි. පූ. 510 සිට ක්‍රි. පූ. 430 දක්වා කාල පරිච්ඡේදයත්, ග්‍රීක සාහිත්‍ය විෂයෙහි ඇටික් නාට්‍ය කරුවන් හා ලේඛකයින් කෙරෙහිත් විශේෂ අවධානය යොමු කරනු ලැබේ. මූල කෘති පිළිබඳ දැනුමට වැඩිපුර ලකුණු දෙනු ලැබේ.

19. **ප්‍රංශ භාෂාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි :—

(I) ප්‍රශ්න පත්‍රය.—17 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වාවූ ප්‍රංශ සාහිත්‍යයෙන් උපුටා ගත් අනියමිත පාඨ පරිවර්තනය ; ඒවායේ ශෛලිය හා අන්තර්ගත කරුණු පිළබඳ ප්‍රශ්න ; ගද්‍ය රචනය.

(II) ප්‍රශ්න පත්‍රය.—මොලියර්, රේසීන්, රූසෝ, හ්‍යුගෝ, ජ්ලෝබා, බොඩ්ලියර්, ගිඩේ, ගිරෝඩෝ යන මේ ලේඛකයන් අතුරෙන් සිව් දෙනකු කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව 17 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා ප්‍රංශ සාහිත්‍යය.

විශේෂයෙන් උගෙනීමට නියමිත ලේඛකයන් පිළිබඳ ප්‍රශ්නයන්ට සැපයෙන පිළිතුරුවලින් ඔවුන්ගේ ප්‍රකට ලක්ෂණ සහිත කෘතීන් අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ පිළිබඳ සවිස්තර අවබෝධයක් පළ විය යුතුය. අන්‍ය ප්‍රධාන ගණයේ ලේඛකයන් පිළිබඳ වූ වඩාත් පොදු ස්වරූපයේ ප්‍රශ්න තෝරා ගැනීමටද අපේක්ෂකයන්ට අවකාශ ලැබේ. එක් ප්‍රශ්නයකට ප්‍රංශ බසින් පිළිතුරු සැපයිය යුතුය.

20. **ඉතිහාසය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—ප්‍රශ්න පත්‍ර හතරක් ඇතත් අපේක්ෂකයන් විසින් ගත යුත්තේ ඉන් දෙකක් පමණි. ඉන් අඩුවෙන් හෝ වැඩියෙන් ගතයුතු නොවේ.

I පත්‍රය.—ඉන්දියා ඉතිහාසය, ක්‍රි. ව. 320 දක්වා

II පත්‍රය.—ලංකා ඉතිහාසය.

III පත්‍රය.—යුරෝපා ඉතිහාසය, 1789 සිට.

IV පත්‍රය.—ඉන්දියානු අර්ධද්වීපයේ ඉතිහාසය හෝ 1707 සිට 1947 දක්වා ඉන්දියානු ඉතිහාසය.

21. **ඉතිහාසය (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—ප්‍රශ්න පත්‍ර අටක් ඇත. එහෙත් අපේක්ෂකයන් විසින් ගත යුත්තේ ඉන් තමන් කැමති හතරක් පමණි :

1 පත්‍රය.—ඉන්දියා ඉතිහාසය, 320–1050.
2 පත්‍රය.—ඉන්දියා ඉතිහාසය, 1050–1526.
3 පත්‍රය.—ඉන්දියානු දේශපාලන වාද, සමාජවාද හා සංස්ථා.
4 පත්‍රය.—ඉන්දියාවෙන් පිටතවූ ඉන්දියානු යටත් විජිත කටයුතු හා සංස්කෘතික කටයුතු.
5 පත්‍රය.—1760 සිට බ්‍රිතාන්‍ය ඉතිහාසය.
6 පත්‍රය.—බ්‍රිතාන්‍ය යටත් විජිත ඉතිහාසය.
7 පත්‍රය.—යුරෝපීය දේශපාලන චින්තාවේ ඉතිහාසය.
8 පත්‍රය.—ලංකා ඉතිහාසය, 1796 සිට.

22. **ආර්ථික විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—අර්ථ නිරූපනය, විෂය සීමාව හා ක්‍රමය, ආර්ථික ක්‍රම, නිෂ්පාදන වාදය, ඵලදායී ව්‍යාපාර යන්ගේ විවිධ ස්වරූප, වික්‍රය, විධානය, මිල නිර්ණය, ඒකාධිකාරයෙහි හා තරඟයෙහි ප්‍රතිඵල, එහි ප්‍රමාණය නිර්ණය කෙරෙනු ජාතික ආදායම් බලවේග ඉතුරු කිරීම හා ආයෝජන මගින් කෙරෙන සේවය, ජාතික ආදායම බෙදී යාම, ආර්ථික ජීවිතයෙහි ලා රජය මගින් කෙරෙන සේවය, පොදු මුදල් කටයුතු ඇතුළු ආර්ථික විද්‍යාවේ මූල ධර්ම.

මුදල්වල ස්වභාව හා අර්ථ නිර්ණය, මිල වෙනස්වීම් පිළිබඳ න්‍යායය, මුදල් ක්‍රම, බැංකු මගින් කෙරෙන කටයුතු, මහ බැංකු ව්‍යාපාරය, මුදල් සංවිධානය හා ප්‍රතිපත්ති පිළිබඳ ගැටළු, ජාත්‍යන්තර ආර්ථික ගනුදෙනු, ගෙවුම් ශේෂය, විනිමය ප්‍රමාණය ඇතුළු බැංකු ව්‍යාපාරය හා ව්‍යවහාර මුදල්.

19 වැනි හා 20 වැනි සියවස් තුළ එංගලන්ත, ප්‍රංශය, ජර්මනිය, රුසියාව හා අමෙරිකා එක්සත් ජනපදය යන රටවල ආර්ථික ඉතිහාසයද ඇතුළු නූතන ආර්ථික ඉතිහාසය.

23. **ආර්ථික විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—ප්‍රශ්න පත්‍ර දහයක් අතුරෙන් අපේක්ෂකයන් විසින් පළමුවැනි ප්‍රශ්න පත්‍ර දෙකටත් ඉතුරු අටෙන් මෙහි යුගල වශයෙන් වරහන් තුළ යොද දක්වා ඇති එක් ප්‍රශ්න පත්‍ර යුගලකටත් පිළිතුරු සැපයිය යුතු වේ :

1 පත්‍රය.—ආර්ථික මූල ධර්ම ; පහළ කොටසෙහි ප්‍රශ්න පත්‍රයට වඩා උසස් තත්ත්වයකය.

2 පත්‍රය.—ලංකාවේ හා ලෝකයේ වර්තමාන ආර්ථික ගැටලු පිළිබඳව අපේක්ෂකයා සතු දැනීම හා අවබෝධය පිරික්සා බැලීම සඳහා සකස්වුනු නූතන ආර්ථික කරුණු පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. නූතන ආර්ථික විද්‍යාමය සඟරා හා ලිපි ලේඛනාදිය අපේක්ෂකයන් විසින් කියවිය යුතු වේ.

3 පත්‍රය } උසස් මූල්‍ය හා බැංකු ව්‍යාපාර න්‍යායය.
4 පත්‍රය } මූල්‍ය ඉතිහාසය හා සංවිධානය. ජාත්‍යන්තර වෙළඳ මුදල්.

5 පත්‍රය } 19 වැනි හා 20 වැනි සියවස් කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව යුරෝපය, අමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ලංකාව යන
6 පත්‍රය } රටවල ආර්ථික ඉතිහාසය.

7 පත්‍රය } ගණිතමය සංඛ්‍යා විස්තර හා ආර්ථික හා වාණිජ කායසිාලයන්හි ලා එය යොදගැනීම.
8 පත්‍රය }

9 පත්‍රය } ලෝකයේ ප්‍රධාන රාජ්‍යයන්හි රාජ්‍යවිධි හා පාලනය ; දේශපාලන න්‍යායය හා සමාජ න්‍යායය. දේශපාලනික චින්තාවන්ගේ
10 පත්‍රය } ඉතිහාසය.

24. **දේශපාලන විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකයි :—

1 වන පත්‍රය—**සමාජ හා දේශපාලන න්‍යාය.**—ජාතික රාජ්‍ය පිළිබඳ න්‍යායන්; මාකියාවෙල්ලි, බොඩින්, හොබ්ස්, ලොක්, රූසෝ, ලිබරල් වාදය, සමාජ වාදය (මාර්ක්ස් වාදය ඇතුළුව) සහ ඒ හා සමාන වාදයන්, පැසිස්ට් වාදය. නවීන රාජ්‍ය පිළිබඳ න්‍යායන්. නිදහස, අයිතිවාසිකම්, සමානාත්මතාවය, දේපල, ජාතික වාදය

2 වන පත්‍රය—**ලංකාවේ දේශපාලන ක්‍රමය (1833 සිට)**. —ලාංකිකයන් අතර දේශපාලන හැඟීම් වර්ධනය වීම, ජාතිකවාදී අදහස්වල නැඟීම, ජාතික නිදහස් ව්‍යාපාරය. දේශපාලන ආයතන හා ජීවායේ විකාශනය. දේශපාලනයට මහජනයාගේ සහභාගීත්වය. දේශපාලන සංවිධාන හා බල කණ්ඩායම්. 1931 සිට ආණ්ඩු ක්‍රමයේ ක්‍රියාකාරිත්වය.

25. **දේශපාලන විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරයි :—

1 වන පත්‍රය—**සංසන්දනාත්මක ආණ්ඩු ක්‍රම හා ආණ්ඩු ක්‍රම මූලධර්ම.**—එක්සත් රාජ්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් සමූහාණ්ඩුව, ප්‍රංශය, ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ස්කැන්ඩිනේවියාව, ජපානය, චීනය, ඉන්දියාව. නවීන ආණ්ඩු ක්‍රමවල විධායක ව්‍යවස්ථාදායක හා අධිකරණ ක්‍රමයන්, පරිපාලන ක්‍රම, නියෝජන ක්‍රමයන්.

2 වන පත්‍රය—**ජාත්‍යන්තර සම්බන්ධතා.**—1914 සිට ප්‍රධාන රටවල් අතර ජාත්‍යන්තර සම්බන්ධතාවයන්. ජාතීන්ගේ සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට සම්බන්ධ අන්‍ය ආයතනයන්. 1945 සිට ජාත්‍යන්තර දේශපාලන තීන්දු කරන ප්‍රධාන සාධකයන්.

3 වන පත්‍රය—**උසස් දේශපාලන චින්තනය—I.**—පැරණි ඉන්දීය දේශපාලන චින්තන (හින්දු හා බෞද්ධ) ග්‍රීක ; ප්ලේටෝ, ඇරිස්ටෝටල්, පෞර රාජ්‍ය පිළිබඳ අදහස්, පැරණි රෝමයේ දේශපාලන චින්තකයන් හා නීති වේදීන්, ඔගස්ටින්, තෝමස් ඇක්වයිනාස්, ඩාන්ටේ, මර්සිලියෝ, රෙපරමාදු ප්‍රතිසංස්කරණ ; ලූතර්, කාල්වින්, නොක්ස්.

4 වන පත්‍රය—**උසස් දේශපාලන චින්තනය—II**
මැකියාවෙල්ලි, බොඩින්.
ඉංග්‍රීසි විප්ලවයේ දේශපාලන චින්තකයන්.
ප්‍රංශ පුනරුදයේ දේශපාලන චින්තකයන්.
ඇමෙරිකන් ආණ්ඩු ක්‍රමයේ ආදි කර්තෘවරුන්.
ඔක්තෝබර් විප්ලවයේ දේශපාලන චින්තකයන්.
චීන විප්ලවයේ දේශපාලන චින්තකයන්.

26. **සමාජ විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි :—

I පත්‍රය—සමාජ විද්‍යාවේ මූලධර්ම—සමාජ විද්‍යාමය විමර්ශන ක්ෂේත්‍රයේ විභාජනය ; සමාජික පැවැත්ම පිළිබඳ ජීව විද්‍යාත්මක වර්ගීය හා භූගෝල විද්‍යාත්මක අර්ථ ව්‍යාඛ්‍යානය විචාරාත්මකව විමසා බැලීම ; සමාජ විද්‍යාව හා වෙනත් මානව විද්‍යාමය හැදෑරීම් හා සාමාජික විද්‍යාවන් හා අතර සම්බන්ධය ; සමාජය, සංස්කෘතිය හා පුද්ගල විශේෂත්වය, අතර ඇති විශ්ලේෂණාත්මක වෙනස්කම් මූලික සාමාජික විකල්පයේ ; සමාජ ව්‍යූහය ; සංස්ථා, ස්තරීභවනය, සාමාජික පාලනය, ගණ සකැස්ම, සමාජ පරිපූර්ණය හා සාමාජික විපර්යාසයද පිළිබඳ සෛද්ධාන්තික සූත්‍ර සම්පාදනය.

II පත්‍රය—සාමාජික ප්‍රශ්න හා සාමාජික පාලනය—අපරාධ විකල්පය ; අපරාධ විද්‍යාවේ ප්‍රවේශ මාර්ග හා ක්‍රම, අපරාධ මර්දන පිළිබඳ ගැටලු, වර්ග විකල්පය ; වර්ගීය ආතතින් පිළිබඳ සමාජ විද්‍යාව, ජන විකාස විද්‍යාව, ජනගහනයේ වැඩීම හා ඒ පිළිබඳ ගැටලු ; ආසියානු රටවල් කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව සමාජ සේවාවන්ගේ සංවර්ධනය හා අන්තර්ගත ද ; සමාජ සේවා පාලනය.

" සමාජ සේවා," " සුභ සාධක සමාජය " යන විකල්පයන්ගේ අර්ථය, රැකීරක්ෂා, මහලුවිය, අධ්‍යාපනය, දුරාචාරය, සෞඛ්‍යය හා රෝග, ගොවි ජනතාවගේ ආර්ථික ප්‍රශ්න ආදිය පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව සාමාජික අවශ්‍යතාවන් හා ප්‍රතිපාදන පිළිබඳ විභාගය (ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.)

**27. සමාජ විද්‍යාව (ඉහළ කොටස)—ප්‍රශ්න පත්‍ර හතරකි :—**

I පත්‍රය—තුලනාත්මක සමාජ සංස්ථා—බන්ධුත්වය හා පවුල, සාමාජික ස්තරීභවනය (කුල භෙදය හා පන්ති භෙදය), ආගම, ආර්ථික ව්‍යුහය, දේශපාලන ව්‍යුහය, නිලබල ක්‍රමය පිළිබඳ න්‍යායය හා රූපික සංවිධාන, තුලනාත්මක හැදෑරීමේ අරමුණු හා ක්‍රම.

II පත්‍රය—ලංකාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව දකුණු ආසියාවේ සමාජ විද්‍යාව—ගොවි සමාජයේ හා ප්‍රජාවේ අර්ථ නිරූපනය ; ප්‍රජ් හැදෑරීම් පිළිබඳ සමාලෝචනය.

ගොවිජන සමාජය පිළිබඳ හැදෑරීම් සඳහාවූ සෛද්ධාන්තික සැලැස්ම.

බන්ධුත්වය හා එය ඉන්දියාව හා ලංකාවද ඇතුළු වෙනත් තෝරාගත් රටවල ස්තරීභවනය ; ආර්ථික ලක්ෂණ, සාර ධර්ම ක්‍රම හා ගොවිජන සමාජයේ වෙනත් සංස්ථාගත ලක්ෂණ.

හින්දු ධර්මයේ හා බෞද්ධ ධර්මයේ සමනුවර්ත හා විසමනුවර්ත සමාජ විද්‍යාව.

ලාංකික පාරම්පරික සමාජයේ ඓතිහාසික විශ්ලේෂණය, වැඩ වසම් ක්‍රමය හා 19 සියවසේ සමාජ විපර්යාසය.

නොදියුණු රටවල ආර්ථික දියුණුව පිළිබඳ ගැටලු.

III පත්‍රය—සමාජ විද්‍යාවේ සිද්ධාන්ත හා ක්‍රම—කොම්ටේ ගෙන් පසුව සිට සමාජ විද්‍යාවේ දියුණුව ; පරිණාමය, ප්‍රසාරණ, ශ්‍රිත වාදය හා අපර පරිණාමයද පිළිබඳ සිද්ධාන්ත, ඩර්කිම්, වේබර්, සිමෙල්, පරේටෝ හා විසිවැනි සියවසට අයත් මලිනොව්ස්කි, රැඩ්ක්ල්ෆ්බ්‍රවුන්, බෝස්, හොබ්හවුස්, පාර්සන්ස් වැනි මානව විද්‍යාඥයින් හා සමාජ විද්‍යාඥයින් ද විසින් ඉදිරිපත් කෙරුණු සිද්ධාන්ත.

**විද්‍යාත්මක ක්‍රමය :** විද්‍යාත්මක විමර්ශණය හා අනුමිතිය පිළිබඳ තර්ක ශාස්ත්‍රය ; අනුමානයේ ස්වභාව, පරීක්ෂණාත්මක ක්‍රමය, විද්‍යාත් මක ක්‍රමය සමාජ විද්‍යාමය ගවේෂණයන් සඳහා යෙදවීම.

සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ ක්ෂෙත්‍ර විධි හා ආනුභාවික ක්‍රම (නියමිත කරුණක් අරභයා පර්යේෂණ සැලැස්මක් සකස් කිරීමට අපේක්ෂකයාට නියම කරනු ලැබිය හැකිය.)

IV පත්‍රය—සමාජික මනෝවිද්‍යාව—පෞරුෂය හැඩගැස්වීමෙහි ලා බලපාන සමාජික කරුණු සාමාජිකරණය, සංස්කෘතිය හා පෞරුෂය, ජාතික ගති ලක්ෂණ, පෞරුෂ වර්ධනය, ඉගෙනීම, ප්‍රත්‍යක්ෂය හා චේතනාවලිය ද පිළිබඳ සිද්ධාන්ත, කුඩා කාණ්ඩ පර්යේෂණ අංශය ද ඇතුළු ගණ ව්‍යුහය හා ගති විද්‍යාව ද පිළිබඳ මනෝ විද්‍යාත්මක විශ්ලේෂණය, මහජන මතය ගොඩ නැංවීමෙහි ලා බලපවත්වන කරුණු. බුද්ධිය සම්බන්ධ ගණ හා පුද්ගල වෙනස්කම්. මනෝ විද්‍යාත්මක ගවේෂණයන්හි ලා උපයෝගී කර ගන්නා ක්‍රම හා විධි.

V පත්‍රය—සාමාජික මානව විද්‍යාව—

(අ) සාමාජික මානව විද්‍යාවේ විෂය සීමාව සහ ක්‍රම. මූලික විකල්පයෝ, උදහරණ.—සමාජය, සමාජ ව්‍යුහය, සමාජ සංවිධාන, ශ්‍රිතය සහ සංස්කෘතිය. සංස්කෘතික වර්ධනය, ව්‍යාප්ති හැදෑරීම, සංස්කෘතීන්ට හුරුවීම සහ සංස්කෘතික විපයඨාස.

(ආ) මෝර්ගන්, ෆ්‍රේසර්, ටයිලර්, රිවර්ස් සහ එලියට් ස්මිත් යන අයගේ කෘතීන් පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව, සාමාජික මානව විද්‍යාවේ ඉතිහාසය.

(ඇ) මානව විද්‍යාවේ මෑත කාලයේදී ඇතිවූ නැඹුරුවීම් ; මැලිනොව්ස්කි, රැඩ්ක්ලිෆ් බ්‍රවුන් සහ එවාන්ස් ප්‍රිචාර්ඩ් යන අයගේ කෘතීන් පිළිබඳ විශේෂ අවධානයෙන් යුතුව, ශ්‍රිතමය මාර්ගය, සංස්කෘතික මාර්ගය.

(ඈ) අග්නිදිග ආසියාවේ සාමාජික මානව විද්‍යාව.

**28. භූගෝල විද්‍යාව (පහළ කොටස)—ප්‍රශ්න පත්‍ර දෙකකි :—**

I පත්‍රය—(අ) භෞතික භූගෝල විද්‍යාව—භූ-ස්වරූප, ජලවහනය, ස්වාභාවික වෘක්ෂ ලතාදිය, පස, දේශගුණය හා කාලගුණය හා මානව භූගෝල විද්‍යාව (මිනිසාගේ ව්‍යාප්තිය, සංක්‍රමණය, විවිධ සමාජ, අර්ථ ක්‍රම) ද පිළිබඳ මූල ධර්ම.

(ආ) (1) ඉන්දියානු ප්‍රදේශයේ (ඉන්දියාව, පකිස්තානය, බුරුමය, ලංකාව) හෝ යුරෝපයේ ප්‍රාදේශීය භූගෝල විද්‍යාව ; භෞතික, මානව හා ආර්ථික ; එසේ නැතහොත් ඇන්ග්ලෝ අමෙරිකාවේ ප්‍රාදේශීය භූගෝල විද්‍යාව ; භෞතික, මානව හා ආර්ථික.

II පත්‍රය—සාමාන්‍ය සිතියම් වැඩ—භූ-ලක්ෂණ සිතියම් (ලංකාව, එක්සත් රාජ්‍යය, එක්සත් ජනපදය), මූලික භූමි මානක්‍රම (දම්වැල්, ප්ලේන් ටේබල, ප්‍රිස්ම, මාලිමා), ප්‍රක්ෂෙපණ (" අන්තර්ගත ලක්ෂණ ", සරල නිර්මාණය) හා ප්‍රස්ථාර (මූලික සංඛ්‍යාමය දත්තයන් දක්වීම්).

**29. භූගෝල විද්‍යාව (ඉහළ කොටස)—ප්‍රශ්න පත්‍ර හතරකි :—**

I පත්‍රය—(අ) උසස් භූ-රූප විද්‍යාව (මූලික භෞතික භූ-විද්‍යාව ද සහිතව), භූ-රූපයන්ගේ පරිණාමය හා ජල විද්‍යාමය රටාවන්ගේ වැඩිම

(ආ) උසස් දේශගුණ විද්‍යාව (මූලික කාලගුණ විද්‍යාව ද සහිතව), දේශගුණ කලාප විකල්පයෝ, ලෝකයේ දේශගුණ වර්ගීකරණය හා රටා ; දේශගුණ විපර්යාසයෝ හෝ

(ඇ) උසස් ජෛව භූගෝල විද්‍යාව හෝ

(ඈ) උසස් කෘෂිකර්ම භූගෝල විද්‍යාව.

II පත්‍රය— (අ) ආර්ථික භූගෝල විද්‍යාව, මූලික නිෂ්පාදන, බලවේග සම්පත්ති හා කර්මාන්ත ; වෙළඳ මධ්‍යස්ථාන හා දේශීය හා ජාත්‍යන්තර වෙළඳාම.

(ආ) ආසියාවේ හෝ එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ හෝ ලතින් අමෙරිකාවේ හෝ ප්‍රාදේශික භූගෝල විද්‍යාව ; භෞතික, මානව, ආර්ථික, ඓතිහාසික හා දේශපාලනික.

III පත්‍රය— (අ) ලංකාවේ හා ඉන්දියාවේ ප්‍රාදේශික භූගෝල විද්‍යාව ; භෞතික, මානව, ආර්ථික, ඓතිහාසික හා දේශපාලනික.

(ආ) අප්‍රිකාවේ හා ඕස්ත්‍රේලියාවේ ප්‍රාදේශික භූගෝල විද්‍යාව හෝ ප්‍රාදේශික කරුණු පිළිබඳ තුලනාත්මක විභාගය හා දේශපාලනික භූගෝල විද්‍යාව.

IV පත්‍රය— (අ) ප්‍රස්තාර විද්‍යාව—ගුවන් ඡායාරූප, භූ-විද්‍යාමය සිතියම් හා භූ-ලක්ෂණ සිතියම් ; මැනීම (ප්ලේන් ටේබල් මැනීම, ත්‍රිකෝණ මැනීම, මට්ටම් මැනීම, සමෝච්ච මැනීම පිළිබඳ ප්‍රතිච්ඡෙදය) ; ප්‍රක්ෂෙපණ හා ප්‍රස්තාර සටහන් (සංකීර්ණ සංඛ්‍යාමය දත්තයන් දක්වීම) හා

(ආ) ප්‍රායෝගික සිතියම් නිර්මාණය පිළිබඳ විධි හා ඒවා ක්‍රියාවේ යෙදවීම (ප්‍රභව, ද්‍රව්‍ය සිතියම් සංස්කරණය, දළ සිතියම් සකස් කිරීම).

**30. පුරා විද්‍යාව (පහළ කොටස)—ප්‍රශ්න පත්‍ර දෙකකි :—**

I වන පත්‍රය—මූල ධර්ම වාස්තු විද්‍යාව, පුරා විද්‍යාවේ ඉතිහාසය, ලංකාවේ චිත්‍ර කර්මය හා ප්‍රතිමා නිර්මාණය.

II වන පත්‍රය—මුල පටන් ක්‍රි.ව. 1505 තෙක් සෙල්ලිපි හා පුරාලේඛන පිළිබඳ දැනීම. ලංකාවේ පැරණි කාසි.

**31. පුරා විද්‍යාව (ඉහළ කොටස)—ප්‍රශ්න පත්‍ර හතරකි :—**

I වන පත්‍රය—ප්‍රාග් ඉතිහාසය, පුරා විද්‍යා මූල ධර්ම හා පැරණි වාස්තු විද්‍යාව. ලංකාවේ පුරා විද්‍යාව පිළිබඳ ඉතිහාසය.

II වන පත්‍රය—ලංකාවේ චිත්‍ර කර්මයේ හා ප්‍රතිමා නිර්මාණයේ ඉතිහාසය.

III වන පත්‍රය—ලංකාවේ බ්‍රාහ්මී ලිපි.

IV වන පත්‍රය—ක්‍රි.ව. 8 සිය වසේ සිට ක්‍රි.ව. 1505 තෙක් සෙල් ලිපි හා පුරා ලේඛන, ලංකාවේ පැරණි කාසි.

**32. මානව විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි. —

**I** වන **පත්‍රය—සාමාන්‍ය සහ භෞතික මානව විද්‍යාව :—**

(අ) **සාමාන්‍ය මානව විද්‍යාව**—භෞතික මානව විද්‍යාවේ, ප්‍රාග් ඓතිහාසික පුරා විද්‍යාවේ හා සමාජ මානව විද්‍යාවේ විෂය සීමාව හා මූලික ක්‍රම. මූලික මානව විද්‍යාත්මක විකල්පයෝ.

(ආ) **භෞතික මානව විද්‍යාව**—ප්‍රධාන මානව ෆොසිල්, මානව පරිනාමය, මූලික පරිනාම වාදය, මානව ජාතීන්ගේ භෞතික ලක්ෂණ, මානව ජාති කොටස් වශයෙන් වෙන් කිරීම හා ඒවායේ පැතිරීම, මූලික ප්‍රවේණි විද්‍යාව.

**II** වන **පත්‍රය—ප්‍රාග් ඓතිහාසික පුරා විද්‍යාව සහ සමාජ මානව විද්‍යාව :—**

(අ) **ප්‍රාග් ඓතිහාසික පුරා විද්‍යාව**—පැරණි, මධ්‍ය හා නූතන ගල් යුගවල පුරා විද්‍යාව, සභ්‍යත්වයේ සම්භවය.

(ආ) **සමාජ මානව විද්‍යාව**—සංස්කෘතියේ හා සමාජයේ ස්වභාවය, සරල සමාජවල සමාජ සංවිධාන ක්‍රම, සරල සමාජවල පවතින ආගම, ඥාතීත්වය හා දේශපාලන සංස්ථා.

**33. බෞද්ධ සංස්කෘතිය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි :—

**I** වන **පත්‍රය**—බෞද්ධ සංස්කෘතිය ඇරඹෙද්දී දඹදිව පැවති ආගමික හා සමාජ තත්ත්වය, නූතන විකාශනයන් ඇතුළුව ඉන්දියාවේ බෞද්ධාගමික බලපෑම් හා ඉතිහාසය.

**II** වන **පත්‍රය**—පැරණි බෞද්ධ නිකායන් සහ ඉන්දියාවෙන් පිටත බෞද්ධාගමේ විකාශනය ; නූතන යුගය ඇතුළුව, ලංකා ඉතිහාසයට අයත් බෞද්ධාගම.

**34. බෞද්ධ සංස්කෘතිය (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි :—

**I** වන **පත්‍රය**—පැරණි බෞද්ධාගමික ආයතන, සංඝයා සහ තපස් සංවිධාන, විනය සහ ශාසනානුගත පිළිවෙත, ගිහි සමාජය සහ එහි සමාජ සංවිධාන, බෞද්ධ වැඳීම් ක්‍රම සහ පූද සිරිත්, බෞද්ධාගමික සමාජ ක්‍රම.

**II** වන **පත්‍රය**—පහත සඳහන් ප්‍රදේශ අතුරෙන් දෙකක බෞද්ධ චිත්‍ර ශිල්පය සහ ගෘහ නිර්මාණ ක්‍රම :—

(අ) ඉන්දියාව, පාකිස්ථානය හා ලංකාව.

(ආ) අග්නිදිග ආසියාව.

(ඇ) ටිබෙටය සහ මධ්‍යම ආසියාව.

(ඈ) චීනය සහ ජපානය.

**III** වන **පත්‍රය**—දේශපාලනයට, සංස්කෘතියට සහ සමාජ ආයතනවලට ඇතිවූ බෞද්ධ බලපෑම් වලට විශේෂ අවධාරණයෙන් යුතුව අග්නිදිග ආසියාව, පැරණි මැද පෙරදිග, ලංකාව, පාකිස්ථානය සහ ඉන්දියාව යන රටවලට ඇතිවූ බෞද්ධ අදහස්වල බලපෑම් හෝ බෞද්ධාගමේ ව්‍යාප්තිය.

**IV** වන **පත්‍රය**—නූතන ලෝකය, ජපානය, කොරියාව, චීනය, මධ්‍යම ආසියාව, ටිබෙටය යන රටවල බෞද්ධාගමේ ව්‍යාප්තිය.

**35. දර්ශන ශාස්ත්‍රය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි—බටහිර දර්ශනයේ ඉතිහාසය :—

(අ) ග්‍රීක දර්ශනය, විද්‍යාත්මක යුගය, විතණ්ඩවාදීහු, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් මැත ආචාර්ය ධර්ම යුගය හා නව ප්ලෙතෝනික වාදය ද කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව.

(ආ) මධ්‍යතන යුගයේ දර්ශනය ; සෙන්ට් ඔගස්ටින්, ස්කොටස්, ඉයුජින්, අන්සෙලම්, තෝමස් ඇක්විනාස්, සෙන්ට් බොනවෙන්තුර්, ඩන්ස් ස්කොටස්, ඇරිස්ටෝටල් වාදයේ පුනර්ජීවය හා සාමාන්‍යයන් පිළිබඳ ගැටලු ද කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව.

(ඇ) නූතන දර්ශනය ; පුනර්ජීවනය බෲනෝ, බේකන්, හොබ්ස්, (බුද්ධිවාද ක්‍රම ඩෙකාටස්, ස්පිනෝසා, ලිබ්නිට්ස්), අනුභූතිවාදය හා අවබෝධය (ලොක්, බර්ක්ලි, හියුම්) හා ජර්මානු විඥාන වාදය (කාන්ට්, fිෂර්, ෂෙලිං, හේගල්) ද කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව.

**ආචාර ධර්ම.**—ආචාර ධර්ම ශාස්ත්‍රයේ ස්වභාව හා විෂය සීමාව ; සදචාරය හා ආගම, සදචාර ඥානය පිළිබඳ ගැටලුව ; සදචාර ප්‍රගතිය, විශ්වාසය හා සිද්ධිය ; චාරිත්‍ර ක්‍රමය, සදචාරය ; සදචාරයේ සාමාන්‍ය මූලධර්ම ; බුද්ධිවාදය ; සුඛ පරමවාදය ; සුඛ සාධන වාදය ; සදචාර ප්‍රයෝගය ; මානව හර පද්ධතිය ; මානව අයිතිවාසිකම්, යුතුකම්, යුතුකම් හා සද්ගුණවල ස්වභාව හා ආචාර ධර්ම ශාස්ත්‍රයෙහි ඒවා දරන තැන ; ආචාර ධර්ම ශාස්ත්‍රීය හා නෛතික යුක්තිය ආර්ථික ජීවිත හා සදචාරය, ලිංගික ජීවිතය, පවුල, රාජ්‍යය හා වෙනත් සංස්ථා.

**36. දර්ශන ශාස්ත්‍රය (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි—**I** වැනි හා **II** වැනි ප්‍රශ්න පත්‍ර තර්ක ශාස්ත්‍රය හා ඥාන විභාගය පිළිබඳය :—

තර්ක ශාස්ත්‍රය හා ඥාන විභාගය පිළිබඳ ප්‍රශ්නය ; යථාර්ථානු භාවය පිළිබඳ න්‍යායයෝ ; ඥාන ප්‍රශ්නය පිළිබඳ අනුභූති වාදත්මක, බුද්ධිවාදත්මක හා විචාරාත්මක දියුණුව ; සංකල්ප වාදය ; විනිශ්චයෝ, අනුමිති, රූපික තර්ක ශාස්ත්‍රය, අධ්‍යාත්ම විද්‍යාමය තර්ක ශාස්ත්‍රය, ගණිත විද්‍යාමය තර්ක ශාස්ත්‍රය, තර්කානුසාරී, යථාභූතවාදය, සත්‍යයේ ස්වභාව, ඥානය හා සත්‍යය පිළිබඳ විවිධ සිද්ධාන්ත, සත්‍ය පරීක්ෂා.

**අධ්‍යාත්ම විද්‍යාව.**—ඥාන විභාගය හා අධ්‍යාත්ම විද්‍යාව හා අතර සම්බන්ධය: තත්කාලීන දර්ශනය, සත්වාදය, නව-සත්වාදය, විචාරාත්මක සත්වාදය, විඥාන වාදය, ප්ලෙතෝනික විඥාන වාදය, බර්ක්ලිගෙ විඥාන වාදය, කාන්ට්ගේ විඥාන වාදය, හේගල්ගේ විඥාන වාදය, නව විඥාන වාදය, නව හේගලීය වාදය, උපයෝ වාදය, සත්භාවය හා පෙනුම පිළිබඳ ප්‍රශ්නය, ආපාතිකතාවේ හරය හා ගුණ ලකුණු, ද්‍රව්‍යය හා ගතිය, අවකාශය හා කාලය, අගය අමෘතය, දෙවියන් හා මැවීම, භාෂාවේ දර්ශනය, නවීන විද්‍යාවේ දර්ශනය යන මේවා කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව අධ්‍යාත්ම විද්‍යාවේ සාමාන්‍ය මූලධර්ම.

**මනෝවිද්‍යාව හෝ ඉන්දීය දර්ශනය.**—අපේක්ෂකයෝ මෙම කොටස් දෙකෙන් එකකට පෙනී සිටිය යුතුය.

**III** සහ **IV** පත්‍ර—**මනෝවිද්‍යාව.**—මනෝවිද්‍යාවේ ස්වභාව හා විෂය සීමාව ; මනෝවිද්‍යා ක්‍රම, මනඃ-කාය සම්බන්ධය, සංවේදනය, ප්‍රත්‍යක්ෂය, ස්මෘතිය, පරිකල්පනය, විකල්පමය චින්තනය, අසංකල්පිත ක්‍රියා, සහජාතයෝ, බුද්ධිය, වේදනායෝ, චිත්තවේගයෝ, භාවයෝ, අධිෂ්ඨානය, පෞරුෂය.

ජන්තු මනෝවිද්‍යාවේ හා මානව විද්‍යාවේ විෂය සීමාව හා ස්වභාව ; පුද්ගලික හා සාමාජික මනෝවිද්‍යාව, ප්‍රායෝගික මනෝවිද්‍යාව, සමකාලීන මනෝවිද්‍යානිකායයෝ, හැසුරුම් වාදය, හෝර්මීය මනෝ විද්‍යාව, ගෙස්ටෝල්ට් මනෝවිද්‍යාව, ස්පියර්මන් ගේ මනෝවිද්‍යාව, චිත්ත විශ්ලේෂණ නිකායයෝ ; ෆ්‍රොයිඩ්, ඇඩ්ලර්, යුන්ග්.

**III** සහ **IV** විකල්ප ප්‍රශ්න පත්‍ර—**ඉන්දියානු දර්ශනය**—වෛදික සූක්තයන්ගේ ආගම හා දර්ශනය, උපනිෂද් ; භගවත් ගීතාවේ හා මහා කාව්‍ය යන්හි ඉගැන්වීම ; බෞද්ධාගමේ හා ජෛන ආගමේ සම්භවය හා ව්‍යාප්තිය : ඉන්දියානු භෞතික වාදය (චාර්වාක), දර්ශන යුගය, න්‍යාය හා වෛශේෂික සත්වාදය හා අණුවාදය, මීමාංසා නිකාය, ජෛනයන්ගේ අනේකාන්ත වාදය (ශ්‍යාද්වාද), පැරණි හීනයාන බෞද්ධ නිකායයෝ ; සාංඛ්‍ය හා යෝග දර්ශනයන්ගේ සම්භවය හා පරිණාමය, මහායාන හා වේදාන්ත නිකායයෝ.

ශංකරගේ අද්වෛත්‍ර වේදාන්ත වාදය හෝ මහායාන බෞද්ධ නිකාය හෝ මුල් අවධියේ බෞද්ධාගම හෝ පිළිබඳ සවිස්තර දැනුමක්.

37. **ශුද්ධ ගණිතය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—වීජ ගණිතය (සංකීර්ණ සංඛ්‍යා ද ඇතුළුවයි), ත්‍රිකෝණ මිතිය, ජ්‍යාමිතිය (ද්විමාන හා ත්‍රිමාන ඛණ්ඩජ්‍යාමිතිය ද ඇතුළුවයි), අවකලනය හා අනුකලනය සහ එක් සවයන්ත විචල්‍යයෙක අවකලන සමීකරණය.

ප්‍රශ්න පත්‍ර දෙකින් එක එකක් සකස් කෙරෙනුයේ මූළු නිර්දේශ පත්‍රයම පදනම් කොටගෙනය.

38. **ප්‍රායෝගික ගණිතය (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—අංශුවක හා දෘඪ වස්තුවක ස්ථිතික හා ගති විද්‍යා, ද්‍රවස්ථිතික විද්‍යාව හා ගුරුත්වාකර්ෂණය.

ප්‍රශ්න පත්‍ර දෙකින් එක එකක් සකස් කෙරෙනුයේ මූළු නිර්දේශ පත්‍රයම පදනම් කොටගෙනය.

39. **ගණිතය (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—වීජ ගණිතය (න්‍යායයන්ද ඇතුළුව). ජ්‍යාමිතිය (ප්‍රක්ෂේපණ ජ්‍යාමිතිය හා අවකලන ජ්‍යාමිතිය) විශ්ලේෂණය හා අවකලන සමීකරණ.

ස්ථිතික විද්‍යාව, ගති විද්‍යාව (ලැග්රේන්ජ් හා ඉයුලර් සමීකරණ ද ඇතුළුව), ගුරුත්වාකර්ෂණය, විද්‍යුතය හා චුම්බකත්වය.

I වැනි හා II වැනි ප්‍රශ්න පත්‍ර ශුද්ධ ගණිතයට ද, III වැනි හා IV වැනි ප්‍රශ්න පත්‍ර ප්‍රායෝගික ගණිතයට ද වෙන් වේ. ඒ එක් එක් ප්‍රශ්න පත්‍රයක් ඊට අදාල වූ මූළු නිර්දේශ පත්‍රය ම පදනම් කොට ගෙන සකස් වේ.

40. **භෞතික විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—සාමාන්‍ය භෞතික විද්‍යාව ; තාපය හා තාප ගති විද්‍යාව : ධ්වනි විද්‍යාව, ජ්‍යාමිතික හා භෞතික ප්‍රකාශ විද්‍යාව, විද්‍යුතය හා චුම්බකත්වය, නූතන භෞතික විද්‍යාව.

41. **භෞතික විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—විශේෂ සාපේක්ෂිතා වාදයද ඇතුළු සාමාන්‍ය භෞතික විද්‍යාව, තාපය හා තාපගති විද්‍යාව, ධ්වනි විද්‍යාව.

'**X**' කිරණ වර්ණාවලික්ෂය ඇතුළු භෞතික ප්‍රකාශන විද්‍යාව ; විද්‍යුත්-චුම්බක වාදය, ප්‍රත්‍යාවර්තක ධාරා අයනයන් ඇතුළු උසස් විද්‍යුත් විද්‍යාව, ඉලෙක්ටෝන් වාදය, ඉලෙක්ටෝන් විද්‍යාව ; වායු සන්නයනය ; ක්වොන්ටම් වාදය ; න්‍යෂ්ටික භෞතික විද්‍යාව ; අන්තරීක්ෂ කිරණ.

42. **රසායන විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—

I පත්‍රය—සාමාන්‍ය හා අකාබනික රසායන විද්‍යා හා භෞතික රසායන විද්‍යාව.

II පත්‍රය—කාබනික රසායන විද්‍යාව.

43. **රසායන විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරකි.—

I පත්‍රය—සාමාන්‍ය හා අකාබනික රසායන විද්‍යාව.

II පත්‍රය—භෞතික රසායන විද්‍යාව.

III පත්‍රය—කාබනික රසායන විද්‍යාව (i).

IV පත්‍රය—කාබනික රසායන විද්‍යාව (ii).

44. **උද්භිද විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—

I පත්‍රය—පටක විද්‍යාව හා සාමාන්‍ය ව්‍යුහ විද්‍යාව, තලසශාකයෝ ; හරිතශාකයෝ පර්ණාංගශාකයෝ ; විවෘත බීජකයෝ.

II පත්‍රය—බීජශකායන්ගේ රූප විද්‍යාව හා වර්ගීකරණ විද්‍යාව ; ශාරීරික විද්‍යාව ; පරිසර විද්‍යාව හා ශාක භූගෝල විද්‍යාව ; සෛල විද්‍යාව ; ප්‍රවේණි විද්‍යා හා පරිණාමය.

**සංලක්ෂ්‍යය.**—ඒ ඒ ප්‍රශ්න පත්‍රවලම විෂයයන් බෙද වෙන් කෙරෙනුයේ ඊට යෝග්‍ය වූ හරස් යොමුවලට අනුවය. වර්ගී කරණය—විශේෂයෙන් ආවෘතබීජක ගෝත්‍ර හා පවුල්වල—හා පරිසර විද්‍යාව ද භූගෝල විද්‍යාව ද සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුව ඇත්තේ ලංකාවේ ශාකවර්ග හා වෘක්ෂ ලතාදිය කෙරෙහිය.

45. **උද්භිද විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර හතරෙකි.—

I පත්‍රය—තලසශාකයෝ, හරිතශාකයෝ, පර්ණාංගශාකයේ හා විවෘතබීජකයෝ ; සංක්ෂිප්ත ශාක ව්‍යාධි විද්‍යාව.

II පත්‍රය—වර්ගීකරණ විද්‍යාවේ මූලධර්ම ; සංවර්ධන හා ප්‍රතිජනක රූප විද්‍යාව ; රූප විද්‍යාව ; බීජ ශාකයන්ගේ ව්‍යුහ විද්‍යාව හා වර්ගීකරණ විද්‍යාව.

III පත්‍රය—ශාරීරික විද්‍යාව, සෛල විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව හා පරිණාමය.

IV පත්‍රය—පරිසර විද්‍යාව හා ශාක භූගෝල විද්‍යාව, සංක්ෂිප්ත ආර්ථික උද්භිද විද්‍යාව.

**සංලක්ෂ්‍යය.**—පහළ කොටසේ නිර්දේශ මාලාවේ සංලක්ෂ්‍යය බලන්න.

46. **සත්ත්ව විද්‍යාව (පහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර දෙකකි.—අපෘෂ්ඨවංශීහු පරිණාමය, සත්ත්වයින්ගේ භූගෝලීය ව්‍යාප්තිය, පෘෂ්ඨවංශීහු, සාමාන්‍ය කලල විද්‍යාව, සෛල විද්‍යාව, ආවේණිය, පරිසර විද්‍යාව.

47. **සත්ත්ව විද්‍යාව (ඉහළ කොටස)**—ප්‍රශ්න පත්‍ර සතරකි. —

අපෘෂ්ඨවංශීහු.

පෘෂ්ඨවංශීහු.

කලල විද්‍යාව (සාමාන්‍ය හා ප්‍රායෝග දර්ශනාත්මක), සෛල විද්‍යාව, ආවේණිය, සත්ත්ව ගති පැවතුම්, පරිණාමයෝ, සත්ත්වයින්ගේ භූගෝලීය ව්‍යාප්තිය, සත්ත්ව පරිසර විද්‍යාව.

ආර්ථික සත්ත්ව විද්‍යාව.

48. **රාජ්‍ය පරිපාලන විද්‍යාව.**—රාජ්‍ය පරිපාලන විද්‍යාව යනු කුමක් ද ? ; පරිපාලන ක්‍රියාවලිය ; විධායකත්වය—එහි බලතල හා සංවිධානය ; රාජ්‍ය නිලධරවාදය ; රාජ්‍ය සේවය—එහි ව්‍යුහය හා කළමනාකරණය ; සමාජ සුබසාධක රාජ්‍යය තුළ ඊට අයත් කාර්ය පද්ධතිය ; පාර්ලිමේන්තුව හා අධිකරණය මගින් පරිපාලනය කෙරෙහි ඇති කෙරෙන පාලනය ; සමාජ සුබසාධක රාජ්‍යයක පරිපාලන ගැටළු ; පාර්ලිමේන්තුව හා අමාත්‍යාංශ මගින් පොදු ව්‍යාපාර කෙරෙහි ඇති කෙරෙන පාලනය ; ලංකාවේ ව්‍යාපාරවල පරිපාලන ගැටළු.

පළාත් ආණ්ඩු ක්‍රමයේ අර්ථ නිරූපනය ; ලංකාවේ පළාත් ආණ්ඩු ක්‍රමයේ සංවර්ධනය ; එහි වර්තමාන ව්‍යුහය ; විවිධ වර්ගයන්හි පළාත් ආණ්ඩු සභාවල ශ්‍රිතයන් හා බලතල ; ඒවායේ මූල්‍ය සම්පාදනය ; පළාත් පලාන සේවා කොමිසම.

49. **රාජ්‍ය මූල්‍ය.**—රාජ්‍ය මූල්‍ය යනු කිම ? අයබදු පිළිබඳ සිද්ධාන්ත, සෘජු හා වක්‍ර අයබදු, අයබදුවල අපතය හා ප්‍රතිඵල, රාජ්‍ය වැය න්‍යාය, රාජ්‍ය වැය පාලනය, රාජ්‍ය ණය න්‍යාය, බදු ප්‍රතිපත්ති, මූල්‍ය පරිපාලනය හා අයවැය ක්‍රියා මාර්ගය, මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය, ලංකාවේ මහ ආණ්ඩුවේ හා පළාත් පාලන ආයතන මූල්‍ය.

50. **ව්‍යාපාර පරිපාලනය—සිද්ධාන්ත හා භාවිතය.**—ව්‍යාපාර පරිපාලන විද්‍යාව හැදෑරීමේ අවශ්‍යතා හා මාර්ග, ලංකාව ගැන විශේෂ සඳහන් ඇතිව ව්‍යාපාර පරිසරය, ව්‍යාපාර සම්පත් හා ඒවායේ ක්‍රියාකාරිත්වය, නෛතික හා වෙනත් ව්‍යාපාර—රාජ්‍ය සම්බන්ධතා. අවස්ථා උදාහරණසේ ගෙන විවිධ පාලන ගැටළු නිරාකරණය කිරීමේ ශක්තිය හා ව්‍යාපාර ගැටළු විසඳීමේදී ද ව්‍යාපාර තීරණ ගැනීමේදී ද ආර්ථික විග්‍රහ ක්‍රම උපයෝගී කර ගැනීමේ ශක්තිය ද අපේක්ෂා කරනු ලැබේ. නූතන ආර්ථික හා ව්‍යාපාරික සංග්‍රහ සහ රජයේ සංයුක්ත මණ්ඩලවල වාර්ෂික වාර්තා පිළිබඳ අනුදැනුමක් අපේක්ෂා කරනු ලැබේ.

51. **පාලන මූල ධර්ම.**—අර්ථ නිරූපනය, ප්‍රමාණය හා පදනම ඇතුළු පාලන ප්‍රතිපත්ති, ව්‍යාපාර පාලන අදහස් සංවර්ධනය වූ අන්දම, පාලනය හා සමාජ වගකීම, සංවිධානය, න්‍යාය, පරිපාලනය පැවැත්ම, පරිපාලනයේ දී මානසික විද්‍යාව උපයෝගී කර ගැනීම, තීරණ ගැනීම සඳහා විද්‍යානුකූල ක්‍රම ඉවහල් කර ගැනීම, තෝරාගත් ක්‍රියාත්මක කොටස්වල පාලන ක්‍රියාමාර්ගය, නිෂ්පාදනය, මූල්‍ය ප්‍රවාහනය, සේවක පරිපාලනය හා කාර්මික සම්බන්ධතා, ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහිදී පාලන ක්‍රම බලපාන අයුරු.

52. **අලෙවි කිරීම.**—අර්ථ නිරූපනය, ප්‍රමාණය, ආර්ථික සංවර්ධනයෙහිදී ඇති වැදගත්කම, පාරිභෝගික ක්‍රියාකාරිත්වය, අලෙවිය හැදෑරීමේ ක්‍රම, අලෙවි කිරීම හා ආයතන (තොග වෙළඳාම හා සුළු වෙළඳාම), අලෙවි ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක විධි: අලෙවිය සඳහා සැකැසුම, මිල නියම කිරීම, බෙද හැරීමේ මාර්ග, භාණ්ඩ බෙදා හැරීම, අලෙවිය පිළිබඳ පර්යේෂණ, ප්‍රචාරය, වෙළඳාම දියුණු කිරීම, මහජන සම්බන්ධතා, සමුපකාර අලෙවිය, ලංකාව ගැන විශේෂ සඳහන් ඇතිව අලෙවි කිරීමේ වෙනස්වන ක්‍රම.

53. **අධ්‍යාපන මනෝවිද්‍යාව—I පත්‍රය.**—බාල අවස්ථාවේ සිට වැඩිහිටි අවධිය දක්වා බුද්ධිමය වර්ධනය. බුද්ධිමය වර්ධනය කෙරෙහි ශාරීරික, සමාජයීය සහ චිත්තවේගී වර්ධනාංශයන්ගේ බලපෑම. සංජානනය, ස්මරණය, චින්තනය හා ගැටළු විසඳීම යන ක්‍රියාවලි. ඉගෙනීම පිළිබඳ මත. ඉගෙනීම් මාරුව. බුද්ධිමය නොවන සාධක ඉගෙනීම කෙරෙහි බලපෑම. විශෙෂ ගණයන්ට ඇතුළුවන ළමයි—මන්ද බුද්ධික ළමයි, සෙමෙන් උගන්නා ළමයි, උසස් දක්ෂතා ඇති ළමයි. ආකල්පයන් හා අගයයන් ඉගෙනීම. පෞරුෂ වර්ධනය හා මානසික සෞඛ්‍යය. අධ්‍යාපනික සංනයනය.

**II පත්‍රය.**—මානසික මිනුම්වල ස්වභාවය. මානසික මිනුම්වලට අදාල සංඛ්‍යාන විද්‍යාත්මක සංකල්ප හා ක්‍රම. අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක මිනුම්වල අපෙක්ෂණ. පරීක්ෂණ පිළියෙල කිරීමේදී උපයෝගි වන සංඛ්‍යාන විද්‍යාත්මක දර්ශක. අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පරීක්ෂණ පිළියෙල කිරීම, ප්‍රමාණ කිරීම හා ප්‍රයෝජනයට ගැනීම.

54. අධ්‍යාපනික මූලධර්ම—

(1) අධ්‍යාපනය යන සංකල්පය හා අධ්‍යාපනික පරමාර්ථ.
(2) අධ්‍යාපනයේ අගයයන්—පෞද්ගලික හා සමාජයීය.
(3) අධ්‍යාපන දර්ශන—ප්ලේටෝ, රූසෝ, ඩිවි, තාගෝර් සහ ගාන්ධි.
(4) අධ්‍යාපනයේ සදාචාරාත්මක හා ආගමික සාධක.
(5) මානුෂික සම්බන්ධතා හා අධ්‍යාපනය.
(6) ආර්ථික ක්‍රමය, දේශපාලනය, සමාජය හා අධ්‍යාපනය. පාඨශාලාව ජාතික ආයතනයක් ලෙස සැලකීම.
(7) සංස්කෘතිය, ප්‍රජාව, සමූහ හා සමාජයීය පුහුණුව.
(8) පාඨශාලාව සමාජයීය ඒකකයක් ලෙස පැවැත්ම.
(9) පාඨමාලාවට අඩංගු වන කරුණු. පාඨමාලාව පිළිබඳ සංකල්පය—සාමාන්‍ය හා විශේෂ අධ්‍යාපනය, පුළුල් හා වෘත්තීය අධ්‍යාපනය පාඨමාලාව සකස් කිරීමේ මූලධර්ම හා බලපෑම්. පාඨමාලාව සංවිධානය කිරීම හා අගය කිරීම. පාඨමාලාව සම්බන්ධ අත්හදා බැලීම්.
(10) විශ්ව විද්‍යාලය හා අනිකුත් උසස් ආයතනවල කාර්යයන් හා බලාපොරොත්තු වන සේවය.
(11) ගුරු වෘත්තිය හා ගුරුවරයාගෙන් කෙරෙන සේවය.

55. **තුලනාත්මක අධ්‍යාපනය**—

(1) **තුලනාත්මක අධ්‍යාපනය පිළිබඳ න්‍යාය**—විවිධ රටවල අධ්‍යාපනික ප්‍රතිපත්ති සහ ව්‍යවහාරය තීරණය කරන දේශපාලන, සමාජික, ආර්ථික සහ සංස්කෘතික කරුණු පිළිබඳ අධ්‍යයනය.

(2) **දියුණු වූ සහ දියුණු වන රටවල අධ්‍යාපනයේ නව ලක්ෂණ**—මේ වර්ගවලට අයත් රටවල් සමූහ කිහිපයක් පිළිබඳ අධ්‍යයනයකින් පැහැදිළි විය යුතුයි.

(3) **ලංකාවේ අධ්‍යාපන ක්‍රමය**—ඓතිහාසික, සංස්කෘතික සහ සමාජ-ආර්ථික දෘෂ්ටි කෝණයන්ගේ හැදෑරීම.

(4) **ලංකාවේ සමකාලීන අධ්‍යාපන ප්‍රශ්න**—වෙනත් රටවල සමාන ප්‍රශ්න හා සසඳමින් අධ්‍යයනය කිරීම.

56. **පුද්ගල හා දේපල නීතිය**—රෝම ලන්දේසි නීතියේ මූල ධර්ම.—ඒවා ලංකාවෙහි ක්‍රියාවෙහි යෙදවීම පිළිබඳ විශෙෂ අවධානයෙන් යුතුව.

57. **බැඳීම් නීතිය**—ගිවිසුම්, සිවිල් වැරදි හා අර්ධ ගිවිසුම් පිළිබඳ රෝම ලන්දේසි නීතියේ මූල ධර්ම ; අදළ වන තන්හි ඉංග්‍රීසි නීතියද සහිතව.

58. **රෝම නීතිය.**—රෝම පුද්ගල නීතිය හා එහි ඉතිහාසය ; ව්‍යවස්ථාදායක හා අධිකරණ ක්‍රියා මාර්ගයන්ගේ ඉතිහාසය ද ඇතුළුව ගයස්ගේ හා ජස්ටිනියන්ගේ ආඥා සම්බන්ධකොට හදල යුතුය. පරිවර්තනය කිරීමට හා විවේචනාත්මක අදහස් පළ කිරීම සඳහා ඡෙදයන් දෙනු ලැබේ. එහෙත් හුදෙක් ග්‍රන්ථ කොටස් පරිවර්තනය කිරීමේ දක්ෂතාවට පමණක් ලකුණු දෙනු නොලැබේ.

59. **රාජ්‍ය විධි නීතිය.**—ඉංග්‍රීසි රාජ්‍ය විධි නීතිය ; එක්සත් රාජ්‍යය හා බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ අනික් කොටස් ද අතර ඇති සම්බන්ධය ලංකාවේ රාජ්‍ය විධි නීතිය.

60. **ජාත්‍යන්තර නීතිය.**—ජාත්‍යන්තර සංවිධානයද ඇතුළු ජාත්‍යන්තර සාම නීතිය.

61. **නීති විද්‍යාව හා නෛතික සිද්ධාන්තය.**—රාජ්‍යත්ව වාදය ද ඇතුළු නීතියේ ස්වභාව පිළිබඳ න්‍යායයෝ ; නීතියේ මූලාරම්භයන් හා එහි වැඩීම ඉංග්‍රීසි හා රෝම නීතිය කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව ; අයිතිවාසිකම් හා යුතුකම් (නෛතික හා සාධාරණ) වල ස්වරූපය හා වර්ගීකරණය නීතියෙහිදී යොදගනු ලබන ප්‍රධාන මතයන් පිළිබඳ විශ්ලේෂණය. නීති විද්‍යා ක්‍රම.

62. **අපරාධ නීතිය.**—ඉංග්‍රීසි අපරාධ නීතිය හා ලංකාවේ අපරාධ නීතිය ; අපරාධ නඩු සංවිධානය අත්හැරය.

63. **වාචසික පරීක්ෂණය (සාමාන්‍ය).**—අපේක්ෂකයා මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ. මෙම මණ්ඩලය මගින් අපේක්ෂකයා පරීක්ෂාවට භාජන කරනුයේ ඔහුගේ ජීවිත චර්යාව පිළිබඳ විස්තර සටහනක් ද තමන් වෙත ඇතිවය. සම්මුඛ පරීක්ෂණයේ දී ඔහුගෙන් පොදු වැදගත් කමින් යුතු කරුණු ගැන ප්‍රශ්න අසනු ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයෙහි පරමාර්ථය වනුයේ අපේක්ෂකයා ඇතුළත්වීමට අදහස් කරන සේවාව සඳහා ඔහු තුළ ඇති යෝග්‍යතාව ගැන විමසා බැලීමය. පරීක්ෂක මණ්ඩලය තමන්ගේ තීරණයන්ට එළඹීමේ දී අපේක්ෂකයා විසින් ප්‍රකට කළ බුද්ධිය, මානසික ප්‍රබෝධය, චරිත ශක්තිය හා චරිත බලය, නායකත්වයෙහි ලා ඔහු තුළ පවත්නා ශක්තිය ද ගැන විශේෂ අවධානයක් දක්වනු ඇත.

## සී—කොටස

64. **ලෝක විත්ති.**—වත්මන් ලෝකය පිළිබඳව විශේෂ අවධානයෙන් යුතුව, ලෝක විත්ති පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා පිළියෙල වූ පැය දෙකක කාලයක් නියමිත ලිඛිත ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින භාෂා මාධ්‍යය අපේක්ෂකයින් විසින් දක්විය යුතුය.

65. **වාචසික පරීක්ෂණය (විශේෂ).**—පුද්ගලික ගුණාංගයන් සහ විදේශ රටවල්, ජාත්‍යන්තර කටයුතු, ජාත්‍යන්තර නීති සහ විදේශ භාෂාවන් පිළිබඳ විශේෂ දැනීම ද, සැලකිල්ලට ගෙන, විදේශ සේවය සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකාවය සොයාබැලීම් සඳහා පවත්වන මෙය සාමාන්‍ය වාචසික පරීක්ෂණයට අමතර වශයෙනි.

5–673—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

(ii) 1970 ජූනි මස 29 වැනි දිනට හෝ ඉන් පෙර හෝ එක්සත් රාජ්‍යයේ සේවාවන් යටතේ යටත් පිරිසෙයින් සිව් අවුරුද්දක සතුටුදායක අඛණ්ඩ සේවයක් සපුරා සිටි එහෙත් 5 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපනික සුදුසුකම් නොමැති අයට, ඉදින් තමන් 6(iii) අ(අ) කොටස යටතේ සඳහන් වුණු විභාගවලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමාර්ථය ලබා ඇතොත්, මෙම පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

5. ආ. **සුදුසුකම්.—යුද්ධ හමුදාවේ සේවා මුක්ත භටයන්ට දෙන විශේෂ අනුග්‍රහ.**—යුද හමුදාවන් හි යෙදී සිටි සේවා මුක්ත වූ අය පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(i) මෙහි 5 ඡේදයේ (iv) කොටසෙහි දක්වන ලද වයස් සීමාව සඳහා වයස ගණන් ගැනීමේ දී, අවශ්‍ය සහගත ලෙස සේවයෙන් නෙරපන ලද හෝ සේවයෙන් පහ කරන ලද හෝ අවශ්‍ය සහගත ලෙස සේවයෙන් නිදහස් කරන ලද හෝ කිසියම් දුරාචාරී බවක් නිසා සේවයෙන් අස්වීමට සිදු වූ හෝ තැනැත්තන් හැර සේවා මුක්ත වූ අන්‍යයන්ට හෙවත් උප සේවකයන්ට හෝ නිලධරයන්ට සහ භේවා යන්ට හෝ තමන් ස්ථිර හමුදාවේ සේවය කළ කාල පරිච් ඡේදය තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

(ii) අවුරුදු හතරකට නොඅඩු කාලයක් නිත්‍ය භට හමුදාවේ යෙදී සිට එහෙත් මෙහි 5 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපනික සුදුසුකම් නොමැති අයට ඉදින් 6(iii)අ (අ) කොටස යටතේ සඳහන් කරන ලද විභාගයන් අතුරෙන් යටත් පිරිසෙයින් එකකින්වත් සාමාර්ථය ලබා ඇතොත් මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

5. ඇ. **සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා අස් කරනු ලැබූ ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ අනුග්‍රහ.**—ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ නිලයක යෙදී ආණ්ඩුවේ සේවය කළ, එහෙත් සවකීය වැඩ හෝ හැසිරීම අසතුටුදායක වීම නිසා නොව, අන්‍ය වූ හේතූන් නිසා සේවය නවතාලීමට භාජන වූ අය පහත දැක්වෙන අනුග්‍රහය ලැබීමට සුදුස්සෝ වෙති :—

5 වැනි ඡේදයෙහි (iv) වැනි කොටසෙහි දැක්වුණු වයස් සීමාව ගණන් බැලීමේ දී සේවයෙන් පහ කරනු ලැබීමෙන් හෝ වැඩ අසතුටුදායක වීමේ හේතුවෙන් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ආණ්ඩුවේ සේවයෙන් අස්වුණු අය හැර අන්‍ය යන්ට තමන් ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට අවසර දෙනු ලැබේ.

6. **සුදුසුකම් : දැනට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල නියුක්තව සිටින සේවකයන්ට දෙනුලබන අනුග්‍රහ.**—(i) 1970 ජූනි 29 වැනි දිනට නොකඩවා පුරා අවුරුදු දෙකක් සතුටුදායක ලෙස සේවය කොට ඇති තාවකාලික සහකාර සරප්වරුන්ට 1970 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 45ට අඩු නම් අධ්‍යාපන සුදුසුකම් ගැන නොසලකා විභාග යට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ii) 6 (i) වැනි ඡේදයේ දක්වා ඇති අනුග්‍රහයන් ලැබීම සඳහා සුදුසුකම් නැති ආණ්ඩුව යටතේ තාවකාලික තනතුරු දරණ අයට පහත සඳහන් සුදුසුකම් ඇතොත් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) 5 (iii) වැනි ඡේදයෙහි නියමිත අධ්‍යාපන සුදුසුකම් තිබීම ;

(ආ) 1970 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි වීම ;

(ඇ) 1970 ජූනි 30 වැනි දිනට කලින් වූ පුරා අවුරුද්ද තුළ වත් නොකඩවා, සතුටුදායක ලෙස ආණ්ඩුව යටතේ සේවය කර තිබීම.

(iii) අ. 6 (1) සහ 6 (2) ඡේදයෙහි දක්වන ලද සහනයන් ලැබීමට සුදුසුකම් නැත්තාවූ ද, ආණ්ඩුව යටතේ තාවකාලික තනතුරු දරන්නා වූ ද, එහෙත් වර්ෂ 1970 ජූනි 30 වැනි දිනට කලින් වූ පුරා අවුරුදු 4 තුළ නොකඩවා ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටියා වූ ද අයට, පහත දැක්වෙන සුදුසුකම් ඇතොත් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) 6 (iii) අ (අ) ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබීම ;

(ආ) 1970 අගෝස්තු 1 වැනි දිනට වයස අවුරුදු 45ට නොවැඩිවීම.

(iii) 1970 මැයි 19 වැනි දිනට ආණ්ඩුව යටතේ ස්ථිර තනතුරු දරණ අයට පහත (iii) සංලක්ෂ්‍යයේ දැක්වෙන ව්‍යතිරේකයන්ට යටත් ව පහත සඳහන් සුදුසුකම් ඇතොත්, මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) 5 (iii) වැනි ඡේදයෙහි නියම කරන ලද අධ්‍යාපන සුදුසුකම් තිබීම ;

(ආ) 1970 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 45ට නො වැඩි වීම ; සහ

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඔවුන්ගේ සේවය සතුටු දායක බවට සහතික කිරීම සහ සරප් සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඔවුන් නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් සූදානම් ව සිටීම.

(iii) අ. 1970 ජූනි 30 වැනි දිනට අනන්තර පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු හතරක අඛණ්ඩ සේවයක් සපුරා සිටින අයට පහත දැක්වෙන සුදුසුකම් ඇතොත් පහත (iii) සංලක්ෂ්‍යයේ සඳහන් ව්‍යතිරේකයට යටත් ව විභාග යට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(අ) ඔවුන් පහත සඳහන් විභාගවලින් එකකින්වත් සාමාර්ථය ලබා සිටිය යුතුය :—

(i) කේම්බ්‍රිජ් ජූනියර් සහතිකය ;

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨ සහතිකය ;

(iii) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පාඨශාලාවක කණිෂ්ඨ පාඨශාලා සහතිකය ;

(iv) ලන්ඩන් වාණිජ මණ්ඩලයේ ලංකා පරිපාටිය යටතේ ලබන ලද වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකය (සාමාන්‍ය වාණිජ විද්‍යා කොටස හෝ ලඝු ලේඛක ටයිප්කාර කොටස) (විදේශීය) නැතහොත් උසස් වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකය (සාමාන්‍ය වාණිජ විද්‍යා කොටස හෝ ලඝු ලේඛක ටයිප්කාර කොටස) (විදේශීය) ;

(v) ලංකා වාණිජ මණ්ඩලය හා ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිරිනමන ලද වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකය (සාමාන්‍ය වාණිජ විද්‍යා කොටස හෝ ලඝු ලේඛක ටයිප්කාර කොටස) නැතහොත් උසස් වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකය (සාමාන්‍ය වාණිජ විද්‍යා කොටස හෝ ලඝුලේඛක ටයිප්කාර කොටස) ;

(vi) අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලවලින් ප්‍රදානය කරන ලද (පොත් තබන්නන් හෝ ලඝුලේඛක යතුරු ලේඛකයන් හෝ සඳහා වූ) වාණිජ විද්‍යා සහතිකය හෝ උසස් වාණිජ විද්‍යා සහතිකය.

(ආ) 1970 අගෝස්තු 1 වැනි දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ඔවුන්ගේ සේවය සතුටු දායක බවට සහතිකකොට තිබිය යුතු අතර සරප් සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තු වලින් ඔවුන් මුදා හැරීමට කැමති විය යුතු ය.

(i) **සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් 6 (iii) සහ 6 (iii) අ යන වගීවලට අයත් වූ ද, 1956 සැප්තැම්බර් 24 වැනි දිනට පෙර පත් කරනු ලැබුවා වූ ද නිලධාරීන් මෙම විභාගයෙන් සමත් වුවහොත්, ඔවුන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයන් හැටියට සලකනු ඇත.

(ii) **සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් වුණු 6 වැනි ඡේදයේ දැක්වෙන විධිවිධාන යටතේ මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයෙහි දැක්වෙන ආණ්ඩුවේ තනතුරුවලට කෙරෙන පත්වීම්වලට අදාළ වන සාමාන්‍ය කොන්දේසි අතර සඳහන් වන "යුද සේවා සහනයට" සුදුස්සන් නො වනු ඇත.

(iii) **සංලක්ෂ්‍යය.**—6 (iii) සහ 6 (iii) අ ඡේදයන් යටතේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ලිපිකාර හා සැලසුම්කරු සේවය, රබර් පාලක දෙපාර්තමේන්තුවේ ලිපිකාර සේවය, තේ පාලන දෙපාර්තමේන්තුවේ ලිපිකාර සේවය, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලිපිකාර සේවය, ආරෝග්‍යශාලා ලිපිකාර සේවය, දුම්රිය ලිපිකාර සේවය, තැපැල් ලිපිකාර සේවය, රේගු ලිපිකාර සේවය, පළාත් පාලන සේවා කොමිෂන් සභා ලිපිකාර සේවය වැනි දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්ට අයත් නිලධාරීහු සහ ශිෂ්‍ය ගුරුවරු, පළාත් පාලන සේවකයෝ, මණ්ඩල, සංයුක්ත මණ්ඩල සහ සමාන ස්ව තන්ත්‍ර ආයතනවල සේවකයෝ, 63. 12. 4 දින අංකය 629 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 3 වැනි ඡේදයෙහි සඳහන් වර්ගයන්ට අයත්වන ස්ථිර, තාවකාලික සහ අනියම් සේවකයෝ සහ යුද හමුදාවන් හි සහ ලංකා පොලිස් සේවයේ නියුක්ත වූවෝ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෝ නොවෙති. එසේ වුවද, දැනට අමුතුවෙන් නිලධාරීන් බඳවා ගැනීම නවතා ඇති දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන් හි නියුක්තව සිටින නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

7. **අයදුම්පත්.**—(i) මේ විභාගය සඳහා ආදර්ශ අයදුම් පත් ෆෝර්මයක් මේ නිවේදනය අග පළ කර ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් ඊට අනුව **තමා විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන්** භාග ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසිවල පිළියෙල කරගතයුතු අතර, එම අයදුම්පත් **තමන්ගේ අත්අකුරින්ම** සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පාවිච්චි කළයුත්තේ එක් කඩදාසි යක් පමණි. 1 සිට 6 දක්වා කොටු අයදුම් පත්‍රයේ 1 වැනි පිටුවෙහි ද, 7, 8 සහ 9 වැනි කොටු අයදුම් පත්‍රයේ 2 වැනි පිටුවෙහි (පසුපිටෙහි) ද සිටින සේ පිළියෙළ කර ගත යුතුය.

(ii) අයදුම්පත් 1970 ජූනි 30 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් කොළඹ 2, මැලේ වීදිය, තැ. පෙ. 1503, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

එම දිනට පසුව ලැබෙන කිසිම අයදුම් පතක් භාරගනු නොලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, විභාගයේ නම සහ තමන් විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iii) අයදුම් පත්‍රයෙහි රුපියල් 25 ක් වටිනා මුද්දර අලවා අපේක්ෂකයාගේ අත්සන සහ දිනය යොදා විධිප්‍රකාර අවලංගු කොට තිබිය යුතුය.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට සේවයේ යෙදී සිටින අපේක්ෂකයන් විසින් එවනු ලබන අයදුම් පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. 5ඇ වැනි ඡේදය යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් විසින් සිය අයදුම් පත් එවිය යුත්තේ ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙනි. එසේ නො කරන කිසියම් අයදුම්කරුවෙකු වෙතොත් ඔහු විභාගයට නුසුදුස්සෙකු කොට සලකනු ලැබේ. 1970 ජූනි 30 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමකුත් සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

විභාග කොමසාරිස්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට අයදුම්පත් නො එවිය යුතුය.

8. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශපත්‍ර විභාග මධ්‍යස්ථාන භාර පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නො කරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ඉල්ලුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාගශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමිත විභාගශාලාව හැර අන්‍ය විභාග ශාලාවක දී කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ. විභාගයට පෙනී සිටින්නා වූ සෑම අපේක්ෂකයකු විසින් ම විභාගය පවත්වන දිනයෙහි ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග පරිපාලක වෙත භාරදිය යුතුය.

සියළුම විභාග අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනය අග පළ වේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටිති.

යම් කිසි අපේක්ෂකයකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නො ලැබුණහොත් ඔහු විසින් ඒ බව වහාම,

> "කොළඹ 2,
> තැ. පෙ. 1503,
> මැලේ වීදිය,
> විභාග කොමසාරිස්"

යන ලිපිනයට දැනුම් දිය යුතුයි. (විදුලි පණිවුඩ යවන ලිපිනය—"විභාග" කොළඹ කියාවේ.) ප්‍රවේශ පත්‍රය නො ලැබුණ බව විභාග කොමසාරිස්ට දැනුම් දෙන අතර ම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතු යි:—

(1) විභාගයේ නම :————.
(2) සම්පූර්ණ නම :————.
(3) සම්පූර්ණ ලිපිනය :————.
(4) මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලූ විභාග මධ්‍යස්ථානය :————.
(5) තැපැල් කන්තෝරුව, ලියාපදිංචි කළ අංකය සහ අයදුම් පත තැපැල් කළ දිනය :————.

(ii) **විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතුයි.**

විභාග කොමසාරිස්ට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස තාවකාලිකව අවසර දිය හැකි ය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

9. **හැඳින් වීමේ පත්‍ර.**—විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ම විභාගශාලාවේ දී විභාග පරිපාලකගේ සතුටට හේතු වන පරිදි සෑම විෂයයක් පාසාම ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් ඕනෑම එකක් භාර ගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින් වීමේ පත් ;

(ආ) විභාග දිනයට අවුරුදු 3කට නො වැඩි කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රය) ;

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටේ දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක් :—

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ..............................(අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අයගේ බව මම සහතික කරමි.

..............................,
අයදුම්කරුගේ පුරුදු අත්සන.

..............................
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

..............................,
(නම සහ තරාතිරම).

දිනය : ..............................

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය තාවකාලිකය. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) අයදුම්පත සමග වෙන කිසිම ලිපි ලේඛනාදියක් නො එවිය යුතුයි. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියලුම විස්තර අයදුම් පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන සියලුම කරුණුවලින් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍රයක් වුවහොත් එය එහි අන්තර්ගත කරුණු උඩ පමණක් සලකා බලා ප්‍රතික්ෂේප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපේක්ෂකයන් විසින් තමන්ගේ යෝග්‍යතාව, ලියකියවිලිවලින් ඔප්පු කළ යුතු ය. එබඳු වූ අපේක්ෂකයන් එම ලියකියවිලි, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වුවහොත්, එම අවස්ථාවේ දී, ඉදිරිපත් කිරීම හෝ නො එසේ නම් විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාද ව ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීම හෝ කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලි අවශ්‍ය විය හැකිය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවකින් ලඟදී අස් වී හෝ සිටි නම් චරිත සහතිකය ලබා ගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි. නො එසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අධිනීතිඥ කෙනෙක්, හෝ නීතිඥ කෙනෙක්, හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 4,800ක් හෝ ඉන් වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකටව දන්නා කෙළින් ම තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම හා ලිපිනය ද එහි පැහැදිලිසේ සඳහන් ව තිබිය යුතුය.

ආණ්ඩුවේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ උප්පැන්නය ලියා පදිංචි නොකළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් ; කිසියම් අපේක්ෂකයකුහට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම් එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දිනය ය.

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උධෘත හෝ භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බවුතීස්ම පත්‍ර භාර ගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡෙදයේ) අංක 27 හෝ 28 හෝ දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්නයෙන් දැක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ ප්‍රකාර ස්වකීය නම් වෙනස් කළ දැනට ආණ්ඩුවේ තනතුරු දරණ අපේක්ෂකයන් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඈ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියා පදිංචිවීමේ සහතික පත්‍රයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දැක්වෙන සහතිකයක් (උචිත වන පරිදි) ;

(ඇ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැතහොත් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (උදා.—පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්) ;

(ඉ) හේවා පත්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදාවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 5අ, සහ 5ආ ඡෙදයන්හි දැක්වුණු අපේක්ෂකයන් කෙරෙහි ය.)

(ඊ) ආණ්ඩුවේ සේවය පිළිබඳව ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ 5ඇ වැනි ඡේදයෙහි දැක්වුණු අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(උ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ සඳහා ද මෙය රැගෙන ආ යුතු ය.)

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී වුවමනා සියලුම ලිය කියවිලි සූදානම් ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ද අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ අවස්ථාවේ දී වුවමනා සියළු ම ලියකියවිලි ඉදිරිපත් කරන්ට අපොහොසත් වන හෝ විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයකු වෙතොත් ඔහුගේ/ඇගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11. **අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇගේ අපේක්ෂකත්වය අවලංගු කරන්නට පිළිවන.

අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් ඔහු/ඇය දැනුවත් ව ම අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය සිතාමතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් හෝ එසේ නැතහොත් ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමට නුසුදුසුව සිටි බව ඔහු/ඇය සේවය කරන කාලයේ කවර අවස්ථාවක දී හෝ ඔප්පු වුවහොත් අප්‍රමාදව සේවයෙන් පහ කිරීමට පිළිවන.

**නිවේදනයේ සඳහන් නියමයන් සම්පූර්ණයෙන් පිළි නො පදින අයවලුන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.**

12. **මුදල් ආපසු ගෙවීම්.**—කවර කාරණයක් නිසාවත් මුදල් ආපසු ගෙවනු නොලැබේ. මේ විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කරන්නට නො පිළිවන.

13. **විභාගයට පෙනී සිටීම සඳහා ආණ්ඩුවේ නිලධාරීන්ට නිවාඩු දීම.**—විභාග කොමසාරිස් විසින් පිළිගන්නා ලද ඉල්ලුම් පත්‍ර ඇති නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිවාඩු (රාජකාරී නිවාඩු නොවේ) දිය යුතු වේ.

14. **විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්තය. I වන කොටස ලිඛිත පරීක්ෂණයක් ද II වන කොටස වාචක පරීක්ෂණයක් ද වේ.

විභාග විෂයයන් හා එක් එක් විෂයයකට නියමිත ලකුණු ද පහත සඳහන් වේ. ලිඛිත පරීක්ෂණයේ හැම උත්තර පත්‍රයකින් ම නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ. නො පැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැළකීමට ඉඩ තිබේ.

**I වන කොටස (ලිඛිත)**

| | ලකුණු |
|---|---|
| (1) භාෂාව හා රචනය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) වාක්‍ය රචනාවක්, සාරාංශ ලිවීමක් හා භාෂාවේ නිවැරදි ව්‍යවහාරය පරීක්ෂා කිරීමේ ප්‍රශ්න ද ඇතුළත් පැ. $1\frac{1}{2}$ ක පත්‍රයකි. ... ... | 100 |
| (2) අංක ගණිතය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) අංක ගණිතය ද, එකතු කිරීම හා වෙනත් නොයෙක් වගී වල එකතු කිරීම්ද ඇතුළුව, ඉලක්කම් සම්බන්ධ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා වූ පැ. $1\frac{1}{2}$ ක පත්‍රයකි. ... ... ... | 100 |
| (3) සාමාන්‍ය දැනීම (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) විනාඩි 30 ක පත්‍රයකි. ... ... | 50 |
| (4) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) විනාඩි 30 පත්‍රයකි. ... ... | 50 |

මෙම විභාගය සඳහා වූ කාල සටහන පහත දැක්වෙයි :—

පූර්ව භාග 8.30 සිට පූර්ව භාග 10.00 දක්වා—භාෂාව හා රචනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

පූර්ව භාග 10.45 සිට අපරභාග 12.15 දක්වා—අංක ගණිතය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

අපරභාග 1.30 සිට අපරභාග 2.00 දක්වා—සාමාන්‍ය දැනීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

අපරභාග 2.45 සිට අපරභාග 3.15 දක්වා—සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

විභාග කොමසාරිස් විසින් කාල සටහනේ පිටපත් නිකුත් නො කරන බැවින් අපේක්ෂකයන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම කාල සටහන සටහන් කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට දන්වා සිටිනු ලැබේ.

**II වන කොටස (වාචික පරීක්ෂණය)** ... ... 50

වාචික පරීක්ෂණය පවත්වනු ලබන්නේ අපේක්ෂකයා සම්පූර්ණ විභාගයට ඉදිරිපත් වන භාෂාවෙන්ම ය.

පළමුව පවත්වනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයයි. දෙවැනි ව ඉන් ලකුණු ලබාගත් අන්දම අනුව තෝරා ගනු ලබන අපේක්ෂකයන් සඳහා වාචික පරීක්ෂණයක් කොළඹ දී පවත්වනු ලැබේ. එය පැවැත්වෙන දිනය ඒ ඒ අපේක්ෂකයන් වෙත දන්වා එවනු ඇත. පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අපේක්ෂක සංඛ්‍යාව භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් විසින් විභාග කොමසාරිස් සමග ද සාකච්ඡා කිරීමෙන් පසුව තීරණය කරනු ඇත. කෙසේ වුවද, ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් ලබන අපේක්ෂක සංඛ්‍යාව පිරවිය යුතුව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් වාචක පරීක්ෂණය අත්හැර දැමීමට ඉඩ තිබේ.

15. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම හා පත්වීම් දීම.**—සාමාර්ථය ලබන අපේක්ෂකයන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරනු ඇත. පුරප්පාඩු ඇති වන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

16. **ඇබෑර්තු.**—සේවයේ අවශ්‍යතාවයන් ගැන සලකා බලා, මේ විභාගයේ ප්‍රතිඵල අනුව පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් විසින් තීරණය කරනු ඇත.

17. **වෛද්‍ය පරීක්ෂණය.**—සාමාර්ථය ලබන අපේක්ෂකයෝ දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුත්තාහ.

18. මෙම රෙගුලාසි වලින් විස්තර නො කරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම් එය භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1970 මැයි මස 19 වැනි දින,
කොළඹ, මහ භාණ්ඩාගාරයේ දී ය.

## අයදුම් පත්‍රය

**ලංකා විභාග දෙපාර්තමේන්තුව**

විභාග අංකය :
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**සරප් සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1970 අගෝස්තු**

1. මුලකුරු සමග අගට යෙදෙන නම :————.

ස්ත්‍රී පුරුෂ භාවය

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

3. සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයින් කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි.) :————.

4. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති ස්ථානය :—

(පළමු තේරීම) :————.
(දෙවන තේරීම) :————.

5. (අ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ—

(i) පරම්පරාවෙන් ද, නැතහොත් :————.
(ii) ලියාපදිංචි කිරීමෙන් ද, යන බව සඳහන් කරන්න :————.

(ආ) උපන් ස්ථානය :—

(i) අපේක්ෂකයාගේ :————.
(ii) අපේක්ෂකයාගේ පියාගේ :————.
(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තාගේ : ————.
(iv) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

**සංලක්ෂ්‍ය :** අපේක්ෂකයා සහ ඔහුගේ/ඇගේ පියා ද යන දෙදෙනා උපන්නේ ලංකාවේ නම් (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අපේක්ෂකයා හෝ ඔහුගේ/ඇගේ පියා හෝ උපන්නේ ලංකාවෙන් පිටතදී නම් (i), (ii), (iii), (iv) යන සියල්ලම පිරවිය යුතුයි.

6. සුදුසුකම් :—

(අ) විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇත්තේ ඒ පිළිබඳ ගැසට් නිවේදනයේ කුමන ඡේදය/උප ඡේදය යටතේ ද යන බව පැහැදිලිව සඳහන් කරන්න :————.
(ආ) උපන් දිනය :————.
(ඇ) අධ්‍යාපනික සුදුසුකම් :————.

7. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නො කරන ලද්දා වූ වලංගු මුද්දර බවත්, මෙයින් දිවුරා සහතික කරමි.

(ii) මේ විභාගය හා සම්බන්ධ නීති රීතිවලට යටත් වීමට මම එකඟ වෙමි.

8. **මුද්දර කොටුව :**

**සැළකිය යුතුයි**—විභාගාපේක්ෂකයා රුපියල් විසිපහක් වටිනා මුද්දර මෙම කොටුවෙහි අලවා ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.

| |
|---|
| මුද්දර<br>කොටුව<br>රු. 25/- |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

*........................ සේවයේ නියුක්ත/පදිංචි .................... නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1970 ................ මස ...... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————,
නම, පදවිය හා තරාතිරම :————,
ලිපිනය :————.

*(දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි.)

අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධාන යකු, නාවුක, ගගන, යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් බාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කෙනෙකු විසිනි.

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයින් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුයි. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස් සකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාළ සීමාවක් තුල තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිව යුත්තන්ට සැළකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියා සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසල දීත් විභාගශාලාධිපතීන්ටද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නො වන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළු වන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිට වී යාමද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුල සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නො සැළකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහොත් ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්ම යෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යෑම තහනම්ය. මේ සියලු දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබැලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, fපයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටීමේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම්ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසියට යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතින්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාව කට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරද වල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකය කුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වගීයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙ පැත්තේ ම පැහැදිලිවද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුය. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැන්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

5–678—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| (1) 1970.10.1 සිට 71.9.30 තෙක් කුදු රෙදි කෑලි සැපයීම ... | 1970. 6. 23. |
| (2) 1970.10.1 සිට 71.9.30 තෙක් මෙරට කොච්චි පුළුන් සැපයීම | 1970. 6. 23. |
| (3) බිත්ති ඔර්ලෝසු සැපයීම ... | 1970. 7. 14. |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙයි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970. 5. 29 දින,
කොළඹ දීය.

5–681—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

(අ)

## රාජකීය ලංකා නාවික හමුදාව

1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා පහත සඳහන් සැපයීම් සේවා සඳහා කොළඹ 1, තැ. පෙ. 593, කොඩිගහ වීදියේ, රාජකීය ලංකා නාවික හමුදාවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඒ ඒ සැපයීම ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10.00 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| (1) සැපයීම | (2) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අන්තිම දිනය | (3) ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය | (4) ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කිරීම |
|---|---|---|---|
| (අ) ත්‍රිකුණාමලයේ, යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට, සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට මස් සැපයීම ... ... ... ... | දවල් 12.00 14.6.1970 ... | පෙ.ව. 10.00 16.6.1970 ... | පෙ.ව. 10.30 16.6.1970 |
| (ආ) ත්‍රිකුණාමලයේ, යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට අළුත් මාළු සැපයීම | දවල් 12.00 14.6.1970 ... | පෙ.ව. 10.00 16.6.1970 ... | පෙ.ව. 10.30 16.6.1970 |
| (ඇ) කොළඹ යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට අළුත් මාළු සැපයීම | දවල් 12.00 14.6.1970 ... | පෙ.ව. 10.00 16.6.1970 ... | පෙ.ව. 10.30 16.6.1970 |
| (ඈ) කොළඹ, රාජකීය ලංකා නාවික හමුදාවට උදය ආහාර ද්‍රව්‍ය වර්ග සැපයීම ... | දවල් 12.00 14.6.1970 ... | පෙ.ව. 10.00 16.6.1970 ... | පෙ.ව. 10.30 16.6.1970 |
| (ඉ) වැලිසර රාජකීය ලංකා නාවික හමුදාවට මස් සැපයීම ... ... | දවල් 12.00 20.6.1970 ... | පෙ.ව. 10.00 22.6.1970 ... | පෙ.ව. 10.30 22.6.1970 |
| (ඊ) වැලිසර රාජකීය ලංකා නාවික හමුදාවට අළුත් මාළු සැපයීම ... ... | දවල් 12.00 20.6.1970 ... | පෙ.ව. 10.00 22.6.1970 ... | පෙ.ව. 10.30 22.6.1970 |
| (උ) වැලිසර රාජකීය ලංකා නාවික හමුදාවට උදය ආහාර ද්‍රව්‍ය සැපයීම ... | දවල් 12.00 20.6.1970 ... | පෙ.ව. 10.00 22.6.1970 ... | පෙ.ව. 10.30 22.6.1970 |
| (ඌ) වැලිසර රාජකීය ලංකා නාවික හමුදාවට එළවළු, පොල්, කිරිපට්ටි නිෂ්පාදන සැපයීම | දවල් 12.00 20.6.1970 ... | පෙ.ව. 10.00 22.6.1970 ... | පෙ.ව. 10.30 22.6.1970 |
| (එ) කාරෙයිනගර්හි, රාජකීය ලංකා නාවික හමුදාවට, එළවළු, පොල්, කිරිපට්ටි නිෂ්පාදන, මස්, අළුත් මාළු සහ උදය ආහාර ද්‍රව්‍ය වර්ග සැපයීම | දවල් 12.00 24.6.1970 ... | පෙ.ව. 10.00 27.6.1970 ... | පෙ.ව. 10.30 27.6.1970 |
| (ඒ) කාරෙයිනගර්හි රාජකීය ලංකා නාවික හමුදාවට අළුත් මාළු සහ මස් සැපයීම ... | දවල් 12.00 24.6.1970 ... | පෙ.ව. 10.00 27.6.1970 ... | පෙ.ව. 10.30 27.6.1970 |

2. අයදුම්කරුගේ මුදල් තත්ත්වය සහ මෙම සේවා කරගෙන යාමේ හැකියාව පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහිතව ඉදිරිපත් කරන ලිඛිත අයදුමක් මත, ඉහත සඳහන් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත් ඒ ඒ සැපයීම ඉදිරියෙහි II වෙනි තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහනයේ 12.00 දක්වා කොළඹ, කොඩිගහවීදියේ, රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ නාවික හමුදාධිපති විසින් නිකුත් කරනු ලැබේ.

3. ඉහත සඳහන් එක් එක් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට මත්තෙන් රු. 75/- බැගින්, නැවත ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් නාවික හමුදා මූලස්ථානයේදී ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ. මුදල් ඇණවුම් නාවික හමුදාධිපති නමින් විය යුතුයි.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරුවන් තම තමන්ගේ සම්පූර්ණ නම් සහ ලිපින ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරුවන් තමන් ටෙන්ඩර් කිරීමට කැමති ඒ ඒ සැපයීම සහ ස්ථානය සඳහන් කිරීම අවශ්‍යය.

රා. කදිර්ගාමර්,
රෙයාර් අද්මිරාල්.
නාවික හමුදාපති.

නාවික ආහාර හා නිළ ඇඳුම් අංශය,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593, කොළඹ 1,
1970 මැයි මස 17 දින.

5–616—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

## යුද්ධ හමුදා මූලස්ථානය

1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුළ—

(අ) කොළඹ සහ දියතලාවේ පිහිටා ඇති යුද හමුදාවේ, රාජකීය ලංකා නාවික හමුදාවේ සහ රාජකීය ලංකා ගුවන් හමුදාවේ කඳවුරු වලට හා පනාගොඩ සහ කටුකුරුන්දේ පිහිටා ඇති යුද හමුදාවේ කඳවුරුවලට මස් වර්ග සැපයීම,

(ආ) අංක 3 වෙනි කඳවුර, වැක් අංක 18, ල. යු. පු. බ. කාර්ය කරවන බලසේනාව, කන්තලේ, යාපනය, අයියකච්චි සහ මුලතිව් පිහිටා ඇති යුද හමුදාවේ කඳවුරුවලට එළවළු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම,

(ඇ) තල්ලාඩි (මන්නාරම) සහ තොඩ්ඩවෙලි (මන්නාරම) පිහිටා ඇති යුද හමුදාවේ කඳවුරුවලට එළවළු, පලතුරු, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සහ මස් වර්ග සැපයීම

සඳහා 1970 ජූනි මස 17 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ බාලදක්ෂ මාවතේ යුද හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත් ලබා ගැනීම සඳහා, යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාර ගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුය.

පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1970 ජූනි මස 16 වෙනි දින දහවල් 12 දක්වා යුද හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර, කොළඹ, බාලදක්ෂ මාවතේ, පිහිටි යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද්ධ හමුදා ආඥාපති.

1970 මැයි මස 17 වෙනි දින,
යුද හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත, තැ. පෙ. 553,
කොළඹ දීය.

5–658/1—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## යුද්ධ හමුදා මූලස්ථානය

1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුළ—

(අ) කොළඹ සහ දියතලාවේ පිහිටා ඇති යුද හමුදාවේ, රාජකීය ලංකා නාවික හමුදාවේ සහ රාජකීය ලංකා ගුවන් හමුදාවේ කඳවුරු වලට හා පනාගොඩ සහ කටුකුරුන්දේ පිහිටා ඇති යුද හමුදාවේ කඳවුරුවලට එළවළු, පලතුරු, පොල් සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම,

(ආ) දියතලාවේ පිහිටා ඇති යුද හමුදාවේ, රාජකීය ලංකා නාවික හමුදාවේ සහ රාජකීය ලංකා ගුවන් හමුදාවේ කඳවුරුවලට සහ පනාගොඩ, කටුකුරුන්ද, තල්ලාඩි (මන්නාරම) හා තොඩ්ඩවෙලි (මන්නාරම) පිහිටා ඇති යුද හමුදාවේ කඳවුරු වලට අලුත් මාලු සැපයීම,

සඳහා 1970 ජූනි මස 15 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ බාලදක්ෂ මාවතේ යුද හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

ටෙන්ඩර්පත් ලබා ගැනීම සඳහා, යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාර ගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුය.

පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1970 ජූනි මස 14 වෙනි දින දහවල් 12 දක්වා යුද හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර, කොළඹ, බාලදක්ෂ මාවතේ, පිහිටි යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද්ධ හමුදා ආඥාපති.

1970 මැයි මස 17 වෙනි දින,
යුද හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත, තැ. පෙ. 553,
කොළඹ දීය.

5–658/2—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වියුනිසියා ගබඩාවෙන් රටකජු හොන්ඩර 1,000ක් පමණ මිලදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1970 ජූනි 17 වැනි බදාදා ප. ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

දිවයිනේ කච්චේරියකට හෝ කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරන ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි තැනට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත් හා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ කාර්යාලයෙහි නි. මි. යෝ. ක්‍රි. හා වි කෙ. අංශයෙන් 1970 ජූනි 17 වැනි බදාදා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතද සහිතව පුරවා එවිය යුතුයි.

රටකජු සැම්පල් වියුනිසියා ගබඩාවෙහිදී කාර්යාල වේලාවන් අතර පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් හෝ වියුනිසියා ගබඩාවේ ගණකාධිකාරී තැනගෙන් විමසා දැනගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 මැයි 22 වැනිදා,
කොළඹ 7, තැ. පෙ. අංක 537.

5–674—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වියුනිසියා ගබඩාවෙන් තලඇට හොන්ඩර 2,000ක් පමණ මිලදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1970 ජූනි 17 වැනි බදාදා ප. ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

දිවයිනේ කච්චේරියකට හෝ කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරන ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි තැනට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත් හා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ කාර්යාලයෙහි නි. මි. යෝ. ක්‍රි. හා. වි, කෙ. අංශයෙන් 1970 ජූනි 17 වැනි බදාදා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතද සහිතව පුරවා එවිය යුතුයි.

තලඇට සැම්පල් වියුනිසියා ගබඩාවෙහිදී කාර්යාල වේලාවන් අතර පරීක්ෂා කළ හැක. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් හෝ වියුනිසියා ගබඩාවේ ගණකාධිකාරී තැනගෙන් විමසා දැනගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 මැයි 22 වැනිදා,
කොළඹ 7, තැ. පෙ. අංක 537.

5–675—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 7, ජාතික පොළෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් වෙළඳ හලේ සහ කොළඹ මරදානේ ට්‍රිපෝලි වෙළඳ හලේ එකතුවන කුළුබඩු හිස් ගෝනි, අල සහ රතුළූනු හිස් ගෝනි, බෝ. ළූණු හිස් ගෝනි, දියලුනු හිස් ගෝනි සහ කෑලි ගෝනි, 1970.7.1 සිට 1970.9.30 දක්වා කාලයට මිලදී ඉවත් කර ගෙන යාම සඳහා මිල ගණන් කොළඹ 1, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූලි මස 14 වන දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100ක මුදලක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සිය අලෙවිකිරීමේ කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් 1970 ජූලි මස 14 දින දහවල් 12 දක්වා මිල ගණන් පෝරම ලබා ගත හැක. මිල ගණන් ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුය.

ගෝනි මිලදී ගැනීම සඳහා දැනට දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති වෙළඳුන්ගෙන් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ.

වැඩි විස්තර කොළඹ 1, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

අ. වි. ර. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.5.17 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

5–649—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියා උප කොටස

වවුනියා උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් උතුරු කොට්ඨාශය භාර වවුනියාවේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජූනි මස 21 වෙනි ඉරිදා පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000කට නොඅඩු ගණනකට ලියා පදිංචි වී ඇති, ලාංකික වූ කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති පමණක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් එවීමට සුදුස්සෝ වෙති.

| වැඩ විස්තරය | ටෙන්ඩර් ඇප මුදල රු. | දෙපාර්තමේන්තු වෙන් සපයන උපකරණ |
| --- | --- | --- |
| මුලතිව්හි සින්නාර් වේල්ලේ උස්කර තැනූ මාවත ඉදි කිරීමේ ව්‍යාපාරය ... | 25 ... | සිමෙන්ති පමණයි |

3. 1970 ජූනි මස 17 වෙනිදා ප.ව. 3 වන තෙක් කාර්යාල වේලාවන් තුළදී වවුනියාව/වවුනිකුලම/මුලතිව්/යාපනය සහ මන්නාරම යන වාරි-මාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබාගත හැකි පෝරමවල අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වන ප්‍රකාශයන්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. පෝරම නිකුත් කිරීමට ප්‍රථම ඉහත නියමිත කළ පරිදි තැන්පත් මුදලක් ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාලවල හෝ කච්චේරියක වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවෙන් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. ඉහතින් සඳහන් කළ පරිදි සිමෙන්ති පමණක් දෙපාර්තමේන්තුව විසින් වවුනියාවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩාවෙන් සපයනු ලැබේ. ආයුධ හෝ වෙනත් උපකරණ කිසිවක් මෙම වැඩය සඳහා සපයනු නො ලැබේ.

6. මේ සඳහා වැඩි විස්තර වවුනියා උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

එස්. ඕ. ජේ. සෝමනාදර්,
වාරිමාර්ග ඉංජිනේරු,
වවුනියා උප කොට්ඨාශය.

වවුනියාව,
1970 මැයි මස 16 වෙනිදා.

5–594—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අඹේපුස්ස ගොවිපලේ කිරි විකිණීම

අඹේපුස්ස ගොවිපලේ නිෂ්පාදනය කරන එළකිරි විකිණීම සඳහා කොළඹ ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූලි මස 2 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සාමාන්‍යයෙන් මෙම ගොවිපලේ මාසයකට, යොදය සහිත පිරිසිදු කිරි පයින්ට් නව දහසක් (9,000) පමණ නිපදවනු ලැබේ. ටෙන්ඩර් කරු විසින් ටෙන්ඩර් කළ යුත්තේ කිරි පයින්ට් එකක් ගන්නා උපරිම මිළ ගණන වේ.

3. කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 315 දරණ ස්ථානයේ, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයෙන් මේ සඳහා නියමිත පෝර්ම ලබාගෙන ඒ මගින් ටෙන්ඩර් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් නිසිලෙස සකස් කර කවරයක බහා සීල් තබා කවරයේ ඉහළ වම් කෙළවරේ "අඹේපුස්ස ගොවිපලේ කිරි විකිණීමේ ටෙන්ඩරය" යන්න පැහැදිලිව සඳහන් කර "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැපැල් පෙට්ටිය 622, අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 2," යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ ටෙන්ඩර්කරුවන් කැමතිනම් නිසි ලෙස සකස් කළ ටෙන්ඩර් එම ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුය.

4. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ, ටෙන්ඩර් පෝර්මයක් වෙනුවෙන් රුපියල් විසි පහක් (රු. 25) තැන්පත් කළ බවට මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන කාර්යාලයේ දී කළ හැකිය.

5. ටෙන්ඩර් පෝර්ම 1970 ජූලි මස 2 වෙනි දින පෙරවරු 10 දක්වා නිකුත් කරනු ලැබේ.

6. තෝරාගත් කොන්ත්‍රාත්කරු, 1970 ඔක්තෝබර් මස 1 දින සිට ගොවිපලේ කිරි එහිදීම පැමිණ ලබාගත යුතුය. මේ සඳහා ප්‍රවාහන පහසුකම් හා කිරි ඇසිරීමේ භාජන කොන්ත්‍රාත්කරු විසින්ම සපයා ගත යුතුය. කොන්ත්‍රාත්කරු කිරි ගෙනයාම සඳහා නියමිත වේලාවට නොපැමිණීම හෝ ප්‍රමාදවීම් හේතුකොටගෙන නරක්වන කිරි සම්බන්ධව කිසිම පැමිණිල්ලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන කිසිම නිලධාරියකු විසින් භාරගනු නොලැබෙන අතර, කොන්ත්‍රාත්කරුට සැපයීමට නියමිත කිරි ප්‍රමාණය සඳහා ගෙවීම් කිරීමට ඔහු බැඳී සිටිනු ඇත.

7. තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් ඒ බව ඔහුට දැන්වූ පසු නියමිත කාල සීමාවක් ඇතුළත රුපියල් හාර දහස් හත්සිය විසි පහක් (රු. 4,725 ක්) එනම්, දින හතලිස් පහක (45) කිරිවල සාමාන්‍ය වටිනාකම, අඹේපුස්ස ගොවිපලේ කළමනාකරු වෙත මුදලින් තැන්පත් කර ලදුපතක් ලබාගත යුතුය. කොළඹ, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයට කැඳවන ලද දිනකදී, තෝරාගත් කොන්ත්‍රාත්කරු නියමිත බලධාරියා සමඟ ගිවිසුමකට අත්සන් කළ යුතු අතර, ඒ සඳහා මුද්දර ගාස්තුද ඔහු විසින්ම දැරිය යුතුවේ.

8. කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු සෑම මාසයකම අවසාන දිනයේ පස්වරු 1 ට පෙර කොන්ත්‍රාත්කරු විසින් මුළු මාසය මුළුල්ලේ දීම ලබාගත් කිරි සඳහා නියමිත මුදල එකවර අඹේපුස්ස ගොවිපලේ කළමණාකරු වෙත බාරදී රිසිට්පතක් ලබාගත යුතුය.

9. මෙම කොන්ත්‍රාත්තුව කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහු වෙනුවට ක්‍රියා කරන වෙනත් බලධාරියකු විසින් ඉහත සඳහන් අංක (7) හා (8) ඡේදයන්හි සඳහන් කරුණු උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අවලංගු නොකළහොත් හෝ වෙනත් අයුරකින් සළකා බලා දීර්ඝ නොකළහොත් හෝ 1970 ඔක්තෝබර් මස 1 දින සිට 1971 සැප්තැම්බර් 30 දින දක්වා පමණක් වලංගු වන්නේය. එසේවුද වුවත්, දැනට සඳහන් කළ නොහැකි, වෙනයම් හේතුවක් නිසා වුවද ගිවිසුම අවලංගු කොට කොන්ත්‍රාත්තුව නැවැත්වීමේ සියළු බලතල කෘෂිකර්ම අධ්‍යක්ෂකට හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන බලධාරීන් සතුවේ.

10. සාමාන්‍ය කාර්යාල වේලාවන් හිදී අඹේපුස්ස රජයේ ගොවිපලේදී මෙම කිරිවල තත්ත්වය ගැන පරීක්ෂා කිරීමට හැකි අතර, ඒ පිළිබඳ වැඩිමනත් තොරතුරු එම ගොවිපලේ කළමණාකාර මහතාගෙන් ලබා ගත හැකිය.

11. කිසියම් ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම පිළිබඳ අවසාන බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

ඒ. ඩබ්ලිව්. පෙරේරා,
පරිපාලන නිලධාරි (ගො. පා. හා. නි),
කොළඹ.

1970 මැයි මස 12 දින,
කොළඹ දී ය.

5–586—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

මොරටුව තැපැල් කාර්යාලයේ බාල්දි වැසිකිළි ජල මුද්‍රා වැසිකිළි බවට හැරවීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූනි මස 15 දින පෙ. ව. 10 දක්වා සියළුම ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයේ සඳහන් වන දිනයෙහි එකී වේලාවට තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ලේ පිහිටි පෝස්ට්මාස්ටර් ජෙනරාල් තැනගේ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘතිපත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘතිපත්‍ර, කොළඹ, ඇව්ලන් චතුරශ්‍රයේ පිහිටි ප්‍රාදේශීය තැපැල් අධිකාරි (බටහිර දකුණ) කාර්යාලයයෙන් 70.6.10 දින දක්වා ලබාගත හැක.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර්පත්‍ර බහා එවන කවරයේ වම්පස මුදුන් කෙළවරේ "මොරටුව තැපැල් කාර්යාලයේ බාල්දි වැසිකිළි ජලමුද්‍රා බවට හැර වීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර්පත්‍රය" යනුවෙන් සටහන් කළ යුතුය.

5. ටෙන්ඩර්පත්‍ර පැමිණ හෝ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට පමණක් එවිය යුතුය. "අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, කොළඹ 1." ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් විසිපහක් තැපැල් කාර්යාලයක තැන්පත් කර, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ, ඇව්ලන් චතුරශ්‍රයේ, ප්‍රාදේශීය තැපැල් අධිකාරි (බටහිර දකුණ) ගෙන් ඉල්ලුම්කොට මේ පිළිබඳව වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

2–598—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

යොමුව : පිඑස්සී. 1/10/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඩිජොක්සින් යනාදිය සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඩිජොක්සින් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ:—

(i) අංක 14,895 දරණ 1970 පෙබරවාරි මස 27 වැනි දිනැති ''රජයේ ගැසට් පත්‍රයේ'' පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, මහලේකම් කාර්යාලයේ ''බී'' කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.8.25 දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම් වලටත්,

(ii) 1 වැනි ඡේදයේ iv වැනි උප දෙයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථාන යේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

කොළඹ,
1970 මැයි මස 14 දින.

අදල උපලේඛනය/**Schedule referred to**

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Digoxine B. P. 0.25 mgm. each .. .. | 1,800,000 Tablets .. | In bottles of 1,000 tablets |
| 2 .. | Injection of Nalorphine Hydrobromide B.P. containing 10 mgm. per cc | 7,500 × 1 cc ampoules .. | In boxes of 50 ampoules |
| 3 .. | Injection of Hydrocortisone Hemisuccinate Sodium each vial containing the equivalent of 100 mgm. Hydrocortisone suitable for intravenous use | 200,000 Rubber capped vials .. | In boxes of 10 vials |
| 4 .. | Ferrous Gluconate B.P. 5 grains each .. .. | 3,500,000 Tablets .. | In bottles of 1,000 tablets |
| 5 .. | Diphenhydramine Hydrochloride B.P. 50 mgm. .. | 400,000 Capsules .. | In bottles of 1,000 tablets |
| 6 .. | Promethazine Hydrochloride 25 mgm. .. .. | 4,500,000 Tablets .. | In bottles of 500 tablets |
| 7 .. | Paracetamol B.P. 0·5 G .. .. .. | 5,000,000 Tablets .. | In bottles of 1,000 tablets |

5–621—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කැකිරාව පොලිස් ස්ථානයට ජලය සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර ගො. දෙ. අධිකාරි/ඉංජිනේරු ටෙන්ඩර් මණ්ඩල යෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජූනි මස 24 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. අනුරාධපුර ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයා ගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,500කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර්පත් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වණ් 1970 ජූනි මස 13 වැනි සෙනසුරාදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුය.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඒ. ආර්. රත්නරාජා,
අධිකාරි/ඉංජිනේරු, උ. මැ. කො.,
අනුරාධපුර.

අනුරාධපුර,
අධිකාරී/ඉංජිනේරු කාර්යාලය,
1970 මැයි 16 වැනි දින.

5–600—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවට මෙරට නිෂ්පාදනය කරන ලද පිත්තල, යකඩ, වානේ ස්කෝප්ප ඇණ සැපයීම පිළිබඳව එවන ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දු. සා. කාර්යාලය, තැ. පෙ. 355, ඕල්කොට් මාවත, කොළඹ) 1970 ජුලි මස 1 වැනි බදාදා පෙ. ව. 11 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

මරදාන දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාල යෙහි හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කල විට 1970 ජූනි මස 28 වෙනි ඉරිදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

1970 ජුලි 1 වැනි දින පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩිපුර විස්තර දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1970. 5. 29 දින,
කොළඹ.

5–601—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ රත්මලානේ පිහිටි පාලම් අංගනයට මසකට කියුබ් 210 ක් පමණ ගණනේ ¾" කළුගල් කියුබ් 2,500 ක් සැපයීම හා භාරදීම සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1970.6.22 වෙනි සඳුදා පෙරවරු 11 තෙක් කොළඹ 1, මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසිනි.

2. රත්මලානේ ම. මා. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම්පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් සියළු විස්තර ලබා ගත හැක.

3. ටෙන්ඩර්පත් නිකුත් කරන්නේ ටෙන්ඩර් කරුවන් විසින් රු. 200 ක මුදල් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සියක් 70.6.16 අඟහරුවාදා පස්වරු 4.30 ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊට පසු කුවිතාන්සිය ලබාගෙන ඒ අනුව ප්‍රමාද වූ ඉල්ලුම්කරුවන් විසින් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබා ගත හැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ම. මා. දෙ. ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
මහා මාර්ග දෙපාර්තමේන්තුව,
රත්මලාන.

5–581—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

තේක්ක වගාවලට නාම පුවරු 16 ක් සහ ගිනි අවවාද පුවරු 22ක් පමණ සාදා සවිකිරීම සඳහා 1970 ජූනි මස 16 වැනි දින පෙරවරු 9.30 වන තෙක් නැගෙනහිර දිසා වන නිලධාරි, මඩකලපුව විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන්ට රු. 25 ක මුදලක් තැන්පත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘතිපත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

3. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

එස්. මුතයියා,
දිසා වන නිලධාරි, නැ. දි.

දිසා වන කාර්යාලය,
මඩකලපුව, 70.5.14 දින.

5-619—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

කොළඹ, තැ.පෙ. 509, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පොලිතීන් මලු සැපයීම සඳහා 70.6.17 වැනි දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලබන අතර, ඉන් අනතුරුව වහාම ඒවා විවෘත කරනු ලැබේ.

| විස්තරය | ප්‍රමාණය | මිම්ම | සංඛ්‍යාව |
|---|---|---|---|
| පොලිතීන් මලු ... | 9'' × 9'' ... | 300 (ගේජ්) ... | 300,000 |
| එම ... | 9'' × 4'' ... | 200 (එම) ... | 800,000 |

කොළඹ, වන සංරක්ෂකගේ කාර්යාලයේ දී ලබාගත හැකි ආකෘති පත්‍ර මත අනු පිටපතකින් යුක්තව ටෙන්ඩර් සකස් කළ යුතුයි. රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මේ ආකෘතිපත්‍ර 70.6.16 දින හෝ ඊට පෙර ප.ව. 4 දක්වා කාර්යාලීය වේලාවන් තුළදී යථෝක්ත කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් තැන්පත් මුදල් වන සංරක්ෂකගේ නමින්, ලංකා බැංකුවේ, කොළඹ 1 යෝක් වීදියේ අංක 34 දරණ ගිණුමට ගෙවිය යුතුය.

ඇම්. ඇස්. රණතුංග,
වන සංරක්ෂක වෙනුවට.

කොළඹ 2.

5–619—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

පානදුර තැපැල් කාර්යාලයේ බාල්දි වැසිකිළි ජල මුද්‍රා වැසිකිළි බවට හැරවීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූනි මස 15 දින පෙ. ව. 10 දක්වා සියළුම ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතන පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයේ සඳහන් වන දිනයෙහි එකී වේලාවට තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ලේ පිහිටි පෝස්ට්මාස්ටර් ජෙනරාල් තැනගේ කාර්යාලයයේදි විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර, කොළඹ ඇචිලන් චතුරශ්‍රයේ පිහිටි ප්‍රාදේශීය තැපැල් අධිකාරි (බටහිර දකුණ) කාර්යාලයයෙන් 70.6.10 දින දක්වා ලබාගත හැක.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස මුදුන් කෙළවරේ "පානදුර තැපැල් කාර්යාලයේ බාල්දි වැසිකිළි ජලමුද්‍රා බවට හැරවීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සටහන් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර පැමිණ හෝ ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට පමණක් එවිය යුතුය. "අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, කොළඹ 1" ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් විසිපහක් තැපැල් කාර්යාලයක තැන්පත් කර, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ, ඇචිලන් චතුරශ්‍රයේ, ප්‍රාදේශීය තැපැල් අධිකාරි (බටහිර දකුණ) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳව වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට් මාස්ටර් ජනරාල් හා විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

5–595—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

1970 ජූලි මස 17 වැනි දින පෙරවරු 10 දක්වා තනි තට්ටුවේ සහ තට්ටු දෙකේ බස් රථවල සහ ලොරිවල බ්‍රේක් ඩ්‍රම්ස් සෑදීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ වලට ටෙන්ඩර් කැඳවනු ලැබේ. රු. 400 ක ආපසු ගතහැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් හා රු. 30ක ටෙන්ඩර් පෝරම් ගාස්තුවක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් ලබාගත හැක. 1970 ජූලි මස 16 වැනි දින දහවල් 12 වනතෙක් පමණක් පෝරම් කොළ නිකුත් කරනු ලැබේ.

මිළට ගැණුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

5–628—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

## භූ විද්‍යා සමීක්ෂණ දෙපාතීමේන්තුව

කොළඹ—2, ශ්‍රී ජිනරතන පාර අංක 48, භූ විද්‍යා සමීක්ෂණ දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, මොනසයිට් දිග ටොන් 75ක් මිලට ගැනීම සඳහා මිල ගණන් පත්‍ර 1970 ජූලි 23 වැනි දින අපරභාග 2 තෙක් භාරගනු ලැබේ.

මිල ගණන් පත්‍ර සඳහා ටෙන්ඩර් පෝර්ම 1970 ජූලි 22 වැනිදා දහවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ. රු. 50 මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂගෙන් ලබා ගත හැකි පෝර්මවල මිල ගණන් පත්‍ර පිටපතකුත් ඇතිව සකස් කළ යුතුවේ.

මිල ගණන් පත්‍ර කොන්දේසි, වගී විග්‍රහය, ඇහිරීමේ අන්දම සහ බාරදීම යනාදිය, පිළිබඳ සියළු විස්තර භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂගෙන් ලබා ගත හැකි පෝර්මවල මිල ගණන් පත්‍ර පිටපතකුත් ඇතිව සකස් කළ යුතුවේ.

මිල ගණන් පත්‍ර කොන්දේසි, වගී විග්‍රහය, ඇහිරීමේ අන්දම සහ බාරදීම යනාදිය, පිළිබඳ සියළු විස්තර භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂගෙන් ලබා ගත හැකිය.

එල්. ජේ. ඩී. ප්‍රනාන්දු,
භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ.

1970 මැයි මස 16 වැනි දින,
භූ විද්‍යා සමීක්ෂණ දෙපාතීමේන්තුව,
අංක 48, ශ්‍රී ජිනරතන පාර, කොළඹ—2.

5–597—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## මහා මාගී දෙපාතීමේන්තුව

මහා මාගී දෙපාතීමේන්තුවේ රත්මලානේ පිහිටි පාලම් අංගනයට මසකට කියුබ් 120 ක් පමණ ගණනේ ගංගා වැලි කියුබ් 1400 ක් සැපයීම හා බාරදීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1970.6.22 වෙනි සඳුදා පෙරවරු 11 තෙක් කොළඹ මහා මාගී දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායඨාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසිනි.

2. රත්මලානේ ම. මා. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කායඨාලයෙන් ලබා ගත් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් සියළු විස්තර ලබා ගත හැක.

3. ටෙන්ඩර් පත් නිකුත් කරන්නේ ටෙන්ඩර් කරුවන් විසින් රු. 100 ක මුදල් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සියක් 70.5.16 වෙනි අඟහරුවාදා පස්වරු 4.30 ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊට පසු කුවිතාන්සිය ලබා ගෙන ඒ අනුව ප්‍රමාදවූ ඉල්ලුම් කරුවන් විසින් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබා ගත හැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ම. මා. දෙ. ප්‍රධාන කායඨාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කායඨාලය,
මහා මාගී දෙපාතීමේන්තුව—රත්මලාන.

5–582—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**1970.3.10 දින අවසන් කළ 22½″ × 35″/ග්‍රෑම් 50–52—කොළ වශයෙන් යුත් සුදු නිව්ස්ප්‍රින්ට් සැපයීම සඳහා වූ ටැන්ඩරයේ ප්‍රතිඵල**

| | සාර්ථක ටැන්ඩර්කරු | ලැබුණු මිළ ගණන් සංඛ්‍යාව | ඇණවුම් කළ ප්‍රමාණය | දිග ටොන් 1 මි හා වා මිළ රු. ශ. | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|---|
| 1. | චයිනා නැෂනල් ලයිට් ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට්ස් ඉම්පෝට් ඇන්ඩ් එක්ස්පෝට් කෝපරේෂන් | 19 | දිග ටොන් 1,000 | 989 44 | චීනය |
| 2. | බාටෝ ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ්, නිව්යෝක් | 19 | දිග ටොන් 500 | 1,075 86 | අමෙරිකා එක්සත් ජනපදය |

ටී. බී. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970 මැයි මස 10 වෙනි දින.

5–667/1—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**1970.2.24 වැනි දින අවසන් කළ කඩදාසි හා කඩදාසි බෝඩ් සැපයීම සඳහා වූ ටැන්ඩරයේ ප්‍රතිඵල**

| විෂය | විස්තර | ටැන්ඩර් කරුවන්ගේ සංඛ්‍යාව | සාර්ථක ටැන්ඩර්කරු | ඇණවුම් කළ ප්‍රමාණය | දිග ටොන් 1 මි හා වා මිල රු. ශ. | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|---|---|
| 1. | ඩබල් සයිඩඩ් සුපර්ෆයින් වයිට් රියල් ආඩ්— 23″ × 36″/ග්‍රෑම් 102/රා. 60 | 44 | නිච්මෙන් කොම්පැනි ලිමිටඩ් | දිග ටොන් 75 | 2,006 87 | ජපානය |
| 2. | අන්කෝටඩ් බොක්ස් බෝඩ් විත් ග්‍රේ බැක්— 31″ × 48″ ග්‍රෑම් 400 | 16 | ඇණවුම් නොකෙරින | — | — | — |
| 3. | ස්ට්‍රෝබෝඩ්— 25½″ × 30½″/ග්‍රෑම් 455 | 18 | ඇණවුම් නොකෙරින | — | — | — |

ටී. බී. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970 මැයි මස 10 වෙනි දින.

5–667/2—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීම

වෙල්ලාවෙලි අඩවියේ නොයෙක් ස්ථානවල ඇති වන අපරාධවල අප් අඩංගුවට ගත් තේක්ක, වෙලං, හල්මිල්ල, බුරුත යන වර්ගයෙන් දව තොග නැගෙනහිර දිසා වන නිලධාරි විසින් වෙල්ලාවෙලි අඩවි වන නිලධාරි කාර්යාලයේදී 70.6.2 දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන් දැව වෙන්දේසි කිරීමට පෙර එම ස්ථානවල ඇති දැව පරීක්ෂාකර බලා සෑහීමකට පත්විය යුතුය.

වැඩි විස්තර සඳහා වෙල්ලාවෙලි අඩවි වන නිලධාරිගෙන් විමසන්න.

එස්. මුත්තයියා,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී.

1970.3.20 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේදීය.

5–583—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත දැක්වෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ 1970 ජූනි මස 14 වැනි දින පෙ. ව. 10 ට කොළඹ, 3, ගාළුමුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉස්තිරිමක්, ජීප් ටයර්, ටියුබ්, ටයිප්රයිටරයක්, සීනු ඔර්ලෝසුවක්, ලිපි බෑග්, සිදුරු 2 සහිත ගිල් විදුනාවක්, අමුණන යන්ත්‍රයක්, මිණුම් ටේප් පෙට්ටි හෙවි ඩියුටි එරේටර් ප්‍රොක්ටරයක්, දිය යට නිරීක්ෂණයන් සඳහා පාවිච්චි කරන බේකස් කෝප් යන්ත්‍රයක්, ඝන අඩි 10,000 ධාරිතාව සහිත තෙත් වායු නාශක මාපකයක්, හරිකේන් ලාම්පු, විදුලි පන්දම්, ගෑස් ලාම්පුවක්, පෙඩර්ස් එයාර් කන් ඩිසනර්, ජෝගුවක් සහ ස්ටැන් සිල්ස්.

කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු සමග කලින් දිනයක් හා වේලාවක් නියම කරගෙන රාජකාරි වේලාවන් තුළදී, වෙන්දේසියට පෙර මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකිය.

ජයග්‍රාහී ඉල්ලුම්කරුවන් විසින් වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින්ම ගෙවීම් කර මිළදී ගත් භාණ්ඩ ඉවත් කරගත යුතුය.

ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
ගාලු මුවදොර කොළඹ 3,
1970 මැයි මස 14 වැනි දින.

5–585—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසියේ විකිණීම

මොරටුවේ වෙලෝනාවෙහි පිහිටි මගේ ගබඩාවේ තැන්පත් කර ඇති හානිවූ සහ කිළිටිවූ රෙදිපිළි තොගයක් 1970 ජූනි 8 වැනි දින සිට පෙරවරු 9.30 ට එම ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මුළු තොගය කුඩා තොග වශයෙන් විකිණීම සඳහා ඉදිරිපත් කෙරේ. පිළිගත් ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ඉල්ලීමේ සඳහන් වටිනාකම වහාම ගෙවා, තම වියදමින් භාණ්ඩ ගබඩා වෙන් ඉවත්කර ගෙන යන මෙන් නියම කරනු ලැබේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අය මොරටුවේ වෙලෝනාවේ මගේ සහකාර අධ්‍යක්ෂ වරයා සමඟ කලින් යොදගත් පිළිවෙලකට මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක. (දුරකථන අංකය 600 මොරටුව) වැඩි විස්තර සඳහා කරුණාකර මගේ වෙලෝනාවේ සහකාර අධ්‍යක්ෂ හමුවී හෝ 70.5.29 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් හෝ දැන ගන්න.

ලූ. වී. ගුණවර්ධන,
ග්‍රාම/අධ්‍යක්ෂ.

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.
1970 මැයි 22 දින.

හානිවූ සහ කිළිටිවූ රෙදිපිළිවල ලැයිස්තුව පහත දැක්වේ :—

### හානිවූ හා කිළිටිවූ රෙදිපිළි තොගය

| වර්ගය | | ප්‍රමාණය |
|---|---|---|
| 100% පාට දෙපාද සරොම් 1 බී ... ... | | 113 |
| 9% පාට දෙපාද සරොම් 2 බී ... ... | | 49 |
| 45% පාට දෙපාද සරොම් 4 බී ... ... | | 240 |
| 40 × 40 නිමා දෙපාද සරොම් ... ... | | 155 |
| 22% පාට දෙපාද සරොම් 3 බී ... ... | | 32 |
| 22% නිමා දෙපාද සරොම් ... ... | | 1,666 |
| 9% පාට දෙපාද සරොම් ... ... | | 2,135 |
| 9% නිමා දෙපාද සරොම් ... ... | | 1,009 |
| 45% නිමා දෙපාද සරොම් ... ... | | 86 |
| 40 × 40 නිමා තනිපාද සරොම් ... ... | | 36 |
| සුදුරෙදි (ප්‍රතික්ෂෙප) ... ... | යාර | 428 |
| නිල් බෝඩර් සාරි (ප්‍රතික්ෂෙප) ... ... | යාර | 716 |
| සුදු වේට්ටි (ප්‍රතික්ෂෙප) ... ... | යාර | 153 |
| සුදු සැටින් ඩ්‍රිල් (ප්‍රතික්ෂෙප) ... ... | යාර | 608 |
| පාට වොයිල් සාරි රෙදි (ප්‍රතික්ෂෙප) ... | යාර | 357¾ |
| මුද්‍රිත කේම්බ්‍රික් රෙදි කැබැලි (ප්‍රතික්ෂෙප) ... | යාර | 3,085½ |
| සුදු වොයිල් සාරි රෙදි ... ... | යාර | 1,812¼ |
| පොලිස් කාකි ඩ්‍රිල් කැබැලි ... ... | යාර | 2,366½ |
| වැටි රෙදි පාට කළ ... ... | යාර | 10½ |
| සුදු සැටින් ඩ්‍රිල් කැබැලි ... ... | රාත්තල් | 300 |
| මුද්‍රිත කේම්බ්‍රික් රෙදි කැබලි ... ... | රාත්තල් | 5½ |
| සුදු වොයිල් සාරි රෙදි කැබැලි ... ... | රාත්තල් | 225½ |
| කාකි ඩ්‍රිල් කැබැලි ... ... | රාත්තල් | 357½ |
| කමිස රෙදි (පලුදු) ... ... | රාත්තල් | 23¾ |
| කේම්බ්‍රික් (මිශ්‍ර පලුදු) ... ... | රාත්තල් | 228 |
| කාකි පික් ඩ්‍රිල් (ප්‍රතික්ෂෙප) ... ... | යාර | 65 |
| කාකි පික් ඩ්‍රිල් කැබැලි ... ... | රාත්තල් | 90½ |
| කාකි ට්විල් කැබැලි ... | රාත්තල් | 15¾ |
| පාට කේස්මන් කැබැලි ... ... | රාත්තල් | 6 |
| වේට්ටි රෙදි කැබැලි ... ... | රාත්තල් | 137½ |
| බෙඩ්පර්ඩ කෝඩ් කැබැලි ... ... | රාත්තල් | 20 |
| පාට වොයිල් සාරි රෙදි කැබැලි ... ... | යාර | 50¼ |
| පාට කේම්බ්‍රික් (ප්‍රතික්ෂෙප) ... ... | යාර | 27 |
| වොයිල් සාරි රෙදි (පලුදු) ... ... | යාර | 5,786 |
| පාට කේම්බ්‍රික් කැබැලි ... ... | රාත්තල් | 30 |
| දෙපාද සරොම් (ප්‍රතික්ෂෙප) ... ... | | 744½ |
| සුදු සීටින් 64″ ... ... ... | යාර | 126¾ |
| බුක් මුස්ලින් 39″ ... ... ... | යාර | 110½ |
| පාට සැටින් ඩ්‍රිල් 28″ ... ... | යාර | 11½ |
| බුල් තුවා 22″ × 45″ ... ... | | 225 |
| නැප්කින් රෙදි 43″ ... ... ... | යාර | 6 |
| තනි තෝම්බි තුවා ... ... ... | | 74 |
| සුදු ඩ්‍රිල් ... ... ... | යාර | 502 |
| මුද්‍රිත ෂීට් රෙදි 51″ ... ... ... | යාර | 6 |
| සුදු කේම්බ්‍රික් රෙදි ... ... ... | යාර | 366¼ |
| සුදු ට්විල් ... ... ... | යාර | 259¼ |
| නිල් බෝඩර් සාරි ... ... ... | යාර | 27 |
| කාකි ට්විල් 32″ ... ... ... | යාර | 705½ |
| පර්නිෂං පැබ්රික් (පාටකළ) ... ... | යාර | 6¼ |
| මුද්‍රිත බතික් සරොම් රෙදි 50″ ... ... | යාර | 74¾ |
| මුද්‍රිත බතික් සරොම් රෙදි 27″ ... ... | යාර | 6 |
| කාකි පොප්ලින් 36″ ... ... | යාර | 186½ |
| මුද්‍රිත සාය රෙදි ... ... ... | යාර | 48¼ |
| සුදු මැට් ෂර්ටින් ... ... ... | යාර | 59¾ |
| සුදු ෂීටින් 48″ ... ... ... | යාර | 278 |
| සුදු සැටින් ඩ්‍රිල් 28″ ... ... | යාර | 5,677½ |
| පොලිස් කාකි ඩ්‍රිල් ... ... | යාර | 11,518¼ |
| සුදු සරොම් රෙදි 60 × 40 ... ... | යාර | 271½ |
| සුදු සරොම් රෙදි 40 × 40 ... ... | යාර | 109 |
| මුද්‍රිත පිජාමා රෙදි 40 × 40 ... ... | යාර | 768¾ |
| මුද්‍රිත පිජාමා 60 × 40 ... ... | යාර | 293¾ |
| අත් පිස්නා 22″ × 22″ ... ... | | 32 |
| සුදු වේට්ටි රෙදි ... ... ... | යාර | 4,160 |
| සුදු දිග රෙදි 42″ ... ... ... | යාර | 3,077¼ |
| සරොම් රෙදි කැබැලි ... ... | රාත්තල් | 807 |

5–659—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

# තොමුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම—1970 ජූලි මස සිට 1971 ජූනි මස 30 දින දක්වා කාලය සඳහා

1970 ජූලි මස 1 සිට 1971 ජූනි මස 30 දක්වා වූ කාලය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයන්ට අදළ පොදු කොන්දේසි මාලාවට යටත්ව අංක 14,898 හා 1970.3.20 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව, ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර පත්‍ර " 1970/71 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය " යි සඳහන් කර 70.6.7 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටැන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටැන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—

(අ) ටැන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණිය හොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටැන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි පිටිමත් ලෙස සහතික කරනලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තාවූ ද, ටෙන්ඩරයේ දැක්වෙන මුල් ප්‍රමාණයෙන් සියේට 25කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණාඇත්තා වූ ද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩිගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩර්වලට, එම සහතිකයේ, සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදළ තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දැක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරණ සහතික පිට පත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ, වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදිය හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමඟ ම රුපියල් 1,000 කට කච්චෙරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සිය එම තැන්පත් කිරීම වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමිවූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවුවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපතිතුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රා රේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපතිතුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා වෙනත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වා ගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපති තුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

### උපලේඛනය

| අංකය හා ප්‍රදේශය | | තැබෑරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | | ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව |
|---|---|---|---|---|
| 1. මූලතිවු | ... | මුලතිව් සුළු නගර සභාව | ... | පෙ. ව. 10.00 |
| 5. පුදුමාතලන් | ... | පුදුමාතලන් ග්‍රාමය | ... | පෙ. ව. 10.15 |
| 7. වවුනියාව | ... | වවුනියාව නගර සභාව | ... | පෙ. ව. 10.30 |
| 9. වට්ටුවාගල් | ... | වට්ටුවාගල් ග්‍රාමය | ... | පෙ. ව. 10.45 |

බී. සී. පෙරේරා,
වවුනියාවේ දිසාපති.

1970 5.15
වව්නියා දිසාපති කාර්යාලයේදිය.

5–570—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම දිස්ත්‍රික්කයේ රා රේන්ද නැවත විකිණීම—1970 ජූලි මස 1 සිට 1971 ජූනි මස 30 දක්වා කාලය සඳහා

1970 ජූලි මස 1 වැනි ද සිට 1971 ජූනි මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා මන්නාරම් දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයන්ට අදල පොදු කොන්දේසි මාලාවට යටත්ව 1970/71 කාලය සඳහා අංක 14,898 හා 1970.3.20 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව, ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. මන්නාරම් දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර " 1970/71 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය " යි සඳහන් කර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිනයට සහ වේලාවට කලින් එවිය යුතුයි.

3. එක් එක් තැබෑරුම් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුය. තව ද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ :—

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණිය හොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරණ ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා එවිය යුතු අතර එක් තැබෑරුම්කට වැඩියෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරණ අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල්පිටපත සහ එහි පිටිමත් ලෙස සහතික කරණ ලද පිටපතක් අමුණා තිබිය යුතුයි. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තාවූ ද, ටෙන්ඩරයේ දැක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියයට විසි පහකට (25%) අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තා වූ ද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කළ හැකිය. (තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරණ ටෙන්ඩර් කරුවන් විසින් එම රේන්ද විෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම්, අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදළ තැබෑරුමේ පිහිටීම, ගම සහ අංකය දැක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිට පත්වල තිබිය යුතුයි).

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ මන්නාරම් දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ මන්නාරම් දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදීම කළ හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලබන තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුයි.

6. (අ) සෑම ටෙන්ඩර් කරුවෙක්ම එක් එක් තැබෑරුම් සම්බන්ධයෙන් පහත දක්වා ඇති පරිදි මුදල් තැන්පත් කළ යුතුයි. තැන්පත් කළ මුදල මෙම කච්චේරියේ හෝ අන් කච්චේරියක තැන්පත් කළ යුතුයි. තැන්පත් මුදල සම්බන්ධයෙන් වූ කච්චේරි කුවිතාන්සිය ටෙන්ඩරයට අමුණා එවිය යුතුයි.

(ආ) සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය රා රේන්දය මිළයට ගනු ලැබූ අය ලෙස ප්‍රකාශයට පත් කළ වහාම මෙකී විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල අහිමි වනු ඇත.

(ඉ) සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට අත්සන් කළ පසු අසාර්ථක ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආ පසු ගෙවනු ලැබේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය මන්නාරම් දිසාපති තුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරණ ටෙන්ඩර්කරුවා රා රේන්දය මිළයට ගත් අය ලෙස ප්‍රකාශයට පත් කළ වහාම මන්නාරම් දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරණු ලබන මුදල් වහාම දිසාපති තුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුයි.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරණ ලද අය ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වා ගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපති තුමාට දනුම් දිය යුතු අතර, ඒ සඳහා එතුමාගේ අනුමැතිය ලබා ගත යුතුයි.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා මන්නාරම දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

## උපලේඛනය

### මන්නාරම දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්—1970 ජූලි 1 සිට 1971 ජූනි 30 වැනි දින දක්වා

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය | තැන්පත් කළ යුතු මුදල රු. | ටෙන්ඩර් බාර ගන්නා අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|
| 2. මන්නාරම | — | තලේමන්නාරම | 1,500 | 1970.6.3 පෙ.ව. 10.00 |
| 3. මන්නාරම | — | පේසාලේ | 1,500 | 1970.6.3 පෙ.ව. 10.15 |
| 4. මන්නාරම | — | උයිලන්කුලම් | 1,500 | 1970.6.3 පෙ.ව. 10.30 |
| 5. මාන්තෙයි | — | කඩ්ඩියච්චිල් | 500 | 1970.6.3 පෙ.ව. 10.45 |
| 8. මන්නාරම | — | මාළුවාඩි | 1,500 | 1970.6.3 පෙ.ව. 11.00 |

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිසාපති.

1970 මැයි මස 15 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

5-656—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

ගල්කිස්ස, ශ්‍රී ධර්මපාල පාරේ අංක 35/1 දරණ නිවසේ පදිංචි මනමෙල්දූර පියදාස ද සොයිසා මහතාට අයිති, දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ ගාලු නාගරිකයේ හා ගාලු කඩවත් සතර තුළ ගිංතොට පිහිටි කොළඹ පාරේ ප්‍රමාණයෙන් අ. 1, රූ. 1, පර්. 9.66 ක් වූ මැවත අද්දර මලබොඩගහවත්ත නමැති වත්ත ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 548 දරණ ගොඩනැගිල්ල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ලංකා රජයේ උකස් ආඥාපනතේ 61(1) දරණ වගන්තිය යටතේ ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද විශේෂ තීරණයන් විධිමත්ව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීමෙන්, ඒ යටතේ ලැබී ඇති බලතල සහ එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බලය ලත් පරිදි 1952 මාර්තු 1 දින පී. වික්ටර් ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 5 සහ 1957 ජනවාරි 17 දින එෆ්. සී. එල්. කොක් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 670 දරණ උකස්කර පිට, මනමෙල්දූර පියදාස ද සොයිසා මහතා විසින් මෙම බැංකුවට උකස් කරන ලද, දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ හා නාගරිකය තුළ ගිංතොට, කොළඹ පාරේ, බලයලත් මිනින්දෝරු එෆ්. ජී. ස්පෙල්ඩ්වින් විසින් සාදන ලද අංක 2600 හා 1852 නොවැම්බර් 24 වෙනි දිනැති පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් නවයයි දශම හයක් වූ මාවත අද්දර මලබොඩගහවත්ත නමැති ඉඩම සහ පිහිටි වරිපනම් අංක 548 දරණ ගොඩනැගිල්ල සහ ගහ කොළ වැවිලි ඇතුළු සියළු දේ, ඉහත කී උකස්කර පිට අය විය යුතු මුදල වන රු. 25,872.83 ක් අය කර ගනු සඳහාත්, 1967. 8. 25 වෙනි දින සිට වෙන්දේසිය සිදු කරන දින දක්වා රු. 20,506.73 කට අවුරුද්දකට සියයට 5½ බැගින් පොළිය සහ ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියදම් සහ අතිකුත් මුදල් ද අය කර ගනු සඳහා, 1970 ජූනි 25 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 ට එය පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ, හෝටන් පෙදෙසේ, අංක 91 දරණ තැන පිහිටි ලංකා රජයේ උකස් බැංකුවෙන් ලබාගත හැක.

ජේ. පී. සෙනෙවිරත්න,
බලයලත් වෙන්දේසිකරු.

27, ලෙයින් බෑන් වීදිය,
කොටුව,
ගාල්ල.

5-665—70.5.29 දින අංක 14,908 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනය බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය.**

උපලේඛනය

1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්දා ... | 70. 2.27 සිකුරාදා | දහවල් | 12.0 |
| | 70. 3.13 සිකුරාදා ... | 70. 3. 5 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාදා ... | 70. 3.13 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්දා .. | 70. 3.19 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| අප්‍රේල් .. | 70. 4. 3 සිකුරාදා .. | 70. 3.25 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාදා .. | 70. 4. 3 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාදා ... | 70. 4. 8 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාදා ... | 70. 4.17 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්දා ... | 70. 4.23 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| මැයි .. | 70. 5. 8 සිකුරාදා . | 70. 4.30 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාදා ... | 70. 5. 8 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාදා .. | 70. 5.15 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාදා ... | 70. 5.22 සිකුරාදා | ප.ව. | 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාදා ... | 70. 5.29 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්දා ... | 70. 6. 5 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්දා ... | 70. 6.11 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්දා ... | 70. 6.18 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

197. මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.